වාර්ෂික වාර්තාව
2021

රණවිරු සේවා අධිකාරිය

ආරක්ෂක අමාත්‍යාංශය

රණවිරු සේවා අධිකාරිය

මානුෂීය මෙහෙයුමේ දී ජීවිත පූජා කරන ලද රණවිරුවන්ගේ ළඟ ම ඥාතීන් හා රණක්ෂිතයට පත් රණවිරුවන් හා පවුල් සාමාජිකයන්ට අවශ්‍ය සුභසාධනය සැලසීම වෙනුවෙන් 1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් රණවිරු සේවා අධිකාරිය ස්ථාපිත කර ඇත.

රණවිරු සුභසාධනය වෙනුවෙන් ස්ථාපිත එක ම ව්‍යවස්ථාපිත ආයතනය වන රණවිරු සේවා අධිකාරිය දිවයින පුරා විසිරී සිටින රණවිරු ප්‍රජාව ඒකරාශී කර ඔවුන්ගේ සියලු කටයුතු වෙනුවෙන් මැදිහත් වන ප්‍රධානතම පාර්ශවකරුවෙකු වශයෙන් දශක දෙකකට අධික කාලයක් ස්වකීය මෙහෙවර ඉටු කරමින් පවතී.

දීප ව්‍යාප්ත රණවිරු ප්‍රජාව ඒකරාශී කරමින් ක්‍රියාත්මක වන රණවිරු සංසද ජාලය මගින් රණවිරු ප්‍රජාවෙහි අවශ්‍යතා සොයා බලා ඔවුන් වෙත අවශ්‍ය උපදේශනය, මූල්‍ය ආධාර, ණය පහසුකම් ලබා දීම රණවිරු සේවා අධිකාරිය මගින් සිදු කරනු ලබයි.

දශක තුනකට අධික කාලයක් පැවති කුරිරු යුද්ධයේ වින්දිතයන් වශයෙන් පශ්චාත් යුදමය ව්‍යසනකාරී තත්ත්වයෙන් පසුව විවිධ මනෝභාවයන්ට මුහුණ දුන් රණවිරු ප්‍රජාව ආර්ථික, සමාජයීය වශයෙන් බලගැන්වීමේ ජාතික මෙහෙවර ගත වූ පසුගිය දශක දෙක තුළ රණවිරු සේවා අධිකාරියට පැවරී තිබිණි. එම වගකීම උදාර සේවයක් බවට පත් කර ගනිමින් රණවිරු සේවා අධිකාරිය 2021 වසර අවසානය වන විට අති සාර්ථක සුභසාධන කාර්යයන් රැසක් ඉටු කිරීමට හැකියාවක් ලබා ඇත.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම සංකල්පයට අනුව 2021 අයවැය යටතේ රණවිරු සේවා අධිකාරිය වෙනුවෙන් රුපියල් මිලියන 750ක මුදලක් වෙන් කිරීමත් සමග අන් වසරවලට සාපේක්ෂව රණවිරු ප්‍රජාව වෙනුවෙන් ඉතා විශාල වැඩසටහන් ප්‍රමාණයක් දියත් කිරීමට රණවිරු සේවා අධිකාරියට හැකියාව ලැබිණි. එමෙන්ම රාජ්‍ය ආයතනයක් වශයෙන් රණවිරු ප්‍රජාවෙහි අවශ්‍යතා සොයා බලා ඒවාට කඩිනම් විසඳුම් ලබා දෙන අභිමානවත් ආයතනය වශයෙන් රණවිරු සේවා අධිකාරිය මේ දක්වා තම නාමය රණවිරු හදවත් තුළ සනිටුහන් කර ඇත.

1999 අංක 54 දරන පනත යටතේ රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඇ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඈ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට,

ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම;

(ඉ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය සහ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම;

(ඊ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණ ඇතිව කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායයන් පිහිටුවීම; සහ

(උ) අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා දේ කිරීම.

දැක්ම

“රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම”

මෙහෙවර

“ශ්‍රී ලංකාවේ ඒකීයභාවය සුරක්ෂිත කරනු පිණිස ජීවිත පුද කළා වූ අතුරුදහන් වූ හා ආබාධිත වූ රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ මානසික හා සාමාජයීය ස්ථාවරභාවයක් ඇති කිරීම මෙන් ම සේවයේ නියුතු රණවිරුවන් සහ එම පවුල්වල මානසික ප්‍රබෝධයක් ඇති වන අයුරින් ක්‍රියා කිරීම. ”

අධ්‍යක්ෂ මණ්ඩලය

1.මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රා)	-	සභාපති, රණවිරු සේවා අධිකාරිය
2. සෝනියා කෝට්ටෙගොඩ මහත්මිය	-	උප සභාපති - රණවිරු සේවා අධිකාරිය
3. සමන්ති වීරසිංහ මහත්මිය	-	අතිරේක ලේකම් (රාජ්‍ය ආරක්ෂක) රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
ජයන්ත එදිරිසිංහ මහතා	-	අතිරේක ලේකම් (රාජ්‍ය ආරක්ෂක) රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
4. කේ.ඒ.එච්. කුමුදුනි පෙරේරා මහත්මිය	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල් අමාත්‍යාංශය
එච්.ජී.ඩී.එම් අළුත්වත්ත මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ - රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
5.මේජර් ජෙනරල් ඩබ්ජීඑච්ඒඑස් බණ්ඩාර	-	මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව
මේජර් ජෙනරල් ඩබ්එල්පීඩබ්ලිව් පෙරේරා	-	මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව
මේජර් ජෙනරල් එච්එල්වීඑම් ලියනගේ	-	මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව
6. රියර් අද්මිරාල් එස්ඒ වීරසිංහ	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා නාවික හමුදාව
රියර් අද්මිරාල් යූඑස්ආර් පෙරේරා	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා නාවික හමුදාව
රියර් අද්මිරාල් වයිඑන් ජයරත්න	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා නාවික හමුදාව
7. එයාර් වයිස් මාර්ෂල් පීඩීකේටී ජයසිංහ	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා ගුවන් හමුදාව
එයාර් වයිස් මාර්ෂල් එම්ඩීඒපී පායෝ	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා ගුවන් හමුදාව
8. නියෝජ්‍ය පොලිස්පති පීකේජේ අපොන්සු	-	පොලිස් සුභසාධක හා වෛද්‍ය සේවා දිසාව ශ්‍රී ලංකා පොලිසිය
නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු	-	පොලිස් සුභසාධක හා වෛද්‍ය සේවා දිසාව ශ්‍රී ලංකා පොලිසිය
නියෝජ්‍ය පොලිස්පති එස්ඩබ්එම් සේනාරත්න	-	පොලිස් සුභසාධක හා වෛද්‍ය සේවා දිසාව ශ්‍රී ලංකා පොලිසිය
නියෝජ්‍ය පොලිස්පති ඩීජේ පත්මිණි	-	පොලිස් සුභසාධක හා වෛද්‍ය සේවා දිසාව ශ්‍රී ලංකා පොලිසිය
9. මේජර් ජෙනරල් ඩීඑම්එස් දිසානායක (විශ්‍රා)	-	පත්කළ සාමාජික
10. කණිෂ්ක ද සිල්වා මහතා	-	පත්කළ සාමාජික
11. ප්‍රජීවා අල්විස් මහත්මිය	-	පත්කළ සාමාජික

රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමන්ගේ පණිවුඩය



ක්‍රියාන්විතයේදී ජීවිත පරිත්‍යාග කළ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද ආබාධිත රණවිරුවන් හා පවුල් සාමාජිකයින් හට සහන සැලසීම වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය ස්ථාපිත කර ඇත. 1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කර ඇති රණවිරු සේවා අධිකාරිය 2021 වසර වන විට දශක දෙකක් පුරා තම රණවිරු ප්‍රජාව වෙනුවෙන් තම සේවය සලසා ඇත.

ගත වූ 2021 වසර රණවිරු සේවා අධිකාරියේ ප්‍රවර්ධනීය වසරක් ලෙස හැඳින්විය හැකිය. අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව රණවිරු සුභසාධනය සැලසීම වෙනුවෙන් 2021 වසර අයවැය මගින් රණවිරු සේවා අධිකාරිය වෙත රුපියල් මිලියන 750ක මුදලක් වෙන් කිරීමත් සමග මෙතෙක් රණවිරු සේවා අධිකාරියට භාණ්ඩාගාරයෙන් හිමි වූ විශාලතම ප්‍රතිපාදන ප්‍රමාණය හිමි විය. එය රණවිරු සේවා අධිකාරි ඉතිහාසයේ ප්‍රවර්ධනීය අවස්ථාවක් ලෙස හඳුන්වමි.

එලෙස හිමි වුණු රුපියල් මිලියන 750 මගින් නිවාස ණය හා ස්වයං රැකියා ණය ලබා දීම් විශාල ප්‍රමාණයක් හා අධ්‍යාපන ශිෂ්‍යත්ව හා ආධාර ලබාදීම් වෙනුවෙන් පෙර වසරවලට වඩා වැඩි මුදලක් යෙදවූ අතර එම වැඩසටහන් සියල්ලක් ම සාර්ථක ප්‍රගතියක් අත් කර ගෙන ඇත. ක්‍රියාන්විත හේතූන් මත ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන් හට ආබාධිත සහායක උපකරණ බෙදා දීම සඳහා විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් යෙද වූ අතර විද්‍යුත් ක්‍රියාකාරී බයිසිකල්, රෝද පුටු, කෘත්‍රිම අත්, පාද, අත්වාරු, ශ්‍රවණාධාර ආදී උපකරණ රැසක් මිලදී ගැනීමටත් ඒවා රණවිරුවන්ගේ නිවෙස් වෙතටම ගොස් ඔවුන්ගේ මෙහෙවර අගය කරමින් ලබා දීමටත් හැකිවීම 2021 වසර තුළ අප අත් කර ගත් විශාල ජයග්‍රහණයකි.

එමෙන්ම 2021 වසර තුළ ද ගෝලීය වශයෙන් මුහුණ දීමට සිදු වූ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද රණවිරු සේවා අධිකාරිය නව තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ රණවිරු ප්‍රජාව හා සම්බන්ධ වෙමින් රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සිදු කරන ලදී. එකී ක්‍රමවේද තුළින් රණවිරු සුභසාධන සේවා අඛණ්ඩව පවත්වාගෙනයාමට හැකි විය.

මෙම කටයුතු සාර්ථකව ඉටු කර ගැනීමට සහය වූ ආරක්ෂක ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, රණවිරු සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලයටත් කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් මාගේ කෘතවේදීත්වය පුද කරමි.

මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩියු
සභාපති
රණවිරු සේවා අධිකාරිය

පටුන

01. රණක්ෂිතයට පත් රණවිරුවන් පුනරුත්ථාපනය සහ පසුඋවටැන

1.1.හැඳින්වීම

1.2. රණක්ෂිතයටපත් රණවිරුවන් සඳහා සහායක උපකරණ ලබාදීමේ වැඩසටහන

1.3. 2021 වසර තුළ දිස්ත්‍රික් වශයෙන් සහායක උපකරණ සඳහා ඉල්ලීම් ලැබීම්

1.4. උපකරණ වශයෙන් රණවිරුවන් ඉල්ලීම් යොමු කිරීම - 2021

1.4.1. රෝද පුටු ලබාදීම

1.4.1.1. පළාත් වශයෙන් රෝදපුටු ලබාදීම

1.4.2. අත්වාරු ලබාදීම

1.4.3. කිහිලිකරු ලබාදීම

1.4.4. කොමඩ් පුටු ලබාදීම

1.4.5. විද්‍යුත් ආරෝපිත යතුරු පැදි ලබාදීම

1.4.5.1. විශේෂිත යතුරු පැදි ලබාදීම

1.4.6. බස්තම් ලබාදීම

1.4.7. වායු මෙට්ට ලබාදීම

1.5. 2020 වසරේ මිලදී ගත් සහයක උපකරණ ලබාදීම

1.6. පරිත්‍යාගශීලී ආධාර මගින් ලද සහායක උපකරණ ලබාදීම

1.7. 2021 වර්ෂය සඳහා සමස්ත උපකරණ ලබාදීම

1.8. කෘත්‍රිම පාද සැකසීම සඳහා මිනුම් ලබා ගැනීමේ වැඩමුලු පැවැත්වීම

1.9. පළාත් හා දිස්ත්‍රික් වශයෙන් උපකරණ ලබාදීම

02. රණක්ෂිතයටපත් රණවිරුවන්ගේ නිවාසයන්හට සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

2.1. හැඳින්වීම

2.2. සනීපාරක්ෂක ආධාර මුදල් ලබාදීමේ ක්‍රමවේදය

2.3. දිස්ත්‍රික්ක වශයෙන් සනීපාරක්ෂක ආධාර ලබාදීම

2.4. සනීපාරක්ෂක ආධාර ලබාදීමේ ප්‍රගතිය

2.5. සනීපාරක්ෂක ආධාර ලබාදීමට පෙර හා පසු තත්වයන්ගේ ඡායාරූප

03.ක්‍රීඩා අංශය

3.1. හැඳින්වීම

3.2. 2021 වර්ෂය තුළ ක්‍රීඩා අංශය මගින් අත් කර ගත් ජයග්‍රහණ

3.2.1. රණවිරු සේවා අධිකාරි බැඩ්මින්ටන් කණ්ඩායම ජාතික පැරා බැඩ්මින්ටන් තරගාවලියේ දී ජය හිමි කර ගැනීම

3.2.2. රණවිරු සේවා අධිකාරියේ බැඩ්මින්ටන් සංචිතය 69 වන ජාතික බැඩ්මින්ටන් තරගාවලියේ (පැරා තරග අංශයේ) ජයග්‍රහණ අත්පත් කර ගැනීම

3.2.3. ආසියානු පැරා මළල ක්‍රීඩා සංචිතයට රණවිරු සේවා අධිකාරිය වරම් ලැබීම

3.2.4. රණවිරු සේවා මළල ක්‍රීඩා සංචිතයේ ක්‍රීඩකයින් ආසියානු පැරා දෙවන තේරීම් තරගවලදී සුදුසුකම් ලැබීම

3.3. 2021 වර්ෂය තුළ ක්‍රීඩා අංශය මගින් සිදු කරන ලද වෙනත් වැඩසටහන්

3.3.1. ජාතික පැරා බැඩ්මින්ටන් තරගාවලියේ ජයග්‍රහකයන් ඇගයීමට ලක් කිරීම

3.3.2. රණවිරු සේවා ක්‍රීඩා සංචිතයේ ක්‍රීඩකයන් හට විශේෂ ක්‍රීඩා උපකරණ පරිත්‍යාගයක්

3.3.3. මහනුවර දිස්ත්‍රික්කයේ "රණවිරු උයන" රණවිරු ගම්මානයට ක්‍රීඩා උපකරණ බෙදා දීමේ වැඩසටහන

3.3.4. හම්බන්තොට දිස්ත්‍රික්කයේ රණවිරු ගම්මාන සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ බෙදා දීම

3.3.5. කළුතර දිස්ත්‍රික්කයේ රණවිරු ගම්මාන සඳහා ක්‍රීඩා උපකරණ බෙදා දීම

04. නිවාස, යටිතල පහසුකම් සුභසාධන හා ව්‍යවසාය සංවර්ධන මාපිය සුරැකුම් ණය අංශය

4.1. හැඳින්වීම

4.2. විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය

4.2.1.විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය සඳහා රණවිරු සේවා අධිකාරියෙහි කාර්යභාරය

4.2.2.විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කළ පූර්ණ නිවාස සහ අර්ධ නිවාස සංඛ්‍යාව

4.2.3. 2021 වර්ෂය තුළ නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලද ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක වශයෙන්

4.3. "විරු සහන" නිවාස ණය වැඩසටහන

4.3.1. දිස්ත්‍රික්ක අනුව නිවාස ණය ලබාදීම

4.3.2. 2021 නිවාස ණය ලබා දීම - පළාත් අනුව

4.4. "රණවිරු දිරිය" ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය

4.4.1. "රණවිරු දිරිය" ණය ලබා දීමේ ප්‍රගතිය පළාත් අනුව

4.4.2. රණවිරු දිරිය ණය ලබාදීමේ ප්‍රගතිය දිස්ත්‍රික්ක අනුව

4.4.3. ක්ෂේත්‍ර අනුව ස්වයං රැකියා ණය ලබාදීමේ ප්‍රගතිය

4.4.4. රණවිරු දිරිය ණය ව්‍යාපෘතිය මගින් දිරි ගැන්වූ රණවිරු පරපුර

4. 4.4.1. කිතුල් ආශ්‍රිත නව නිෂ්පාදන අලෙවිසැල හා හෙළ බොජුන් හල

4.4.4.2. මහ පොළොවට ජීවය දුන් දිරි විරු ගොවි රජු

4.4.4.3. සුරතල් මත්ස්‍ය ව්‍යාපාරයෙන් දැත් සවිමත් කරගත් රණවිරුවෙක්

4.5. රණවිරු මාපිය සුරැකුම වැඩසටහන

4.6. ඉඩම් අංශය

4.6.1. ඉඩම් කොටස් ලබා දීම

4.6.2. ඉඩම් කොටස් ලබාදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

4.6.3. රජයේ ඉඩම් සඳහා ඔප්පු/බලපත්‍ර ලබාදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

4.6.4. වෙනත් ආයතන සඳහා ලිපි යොමු කිරීම / අඩුපාඩු ගෙන්වා ගැනීම

4.6.5. අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති ඉඩම්

4.6.6. රණවිරු සේවා අධිකාරිය මගින් සිදු කරන ලද ඉඩම් සඳහා ඔප්පු ලබා දීම

05. වෛද්‍ය ආධාර හා ණය ලබාදීම

5.1. වෛද්‍ය ආධාර ලබාදීම

5.2. වෛද්‍ය ණය ලබාදීම

5.3. වෛද්‍ය ණය හා ආධාර ලබාදීමේ ක්‍රමවේදය

5.4. වෛද්‍ය ආධාර ප්‍රතිලාභ බෙදී යාම

5.5. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ආධාර ලබාදීම

5.6. වෛද්‍ය ණය ප්‍රතිලාභ බෙදීයාම

5.7. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ණය ලබාදීම

06. අධ්‍යාපන ශිෂ්‍යත්ව හා තරුණ කටයුතු අංශය

6.1. හැඳින්වීම

6.2. අංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

6.2.1. 6 – 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යාධාර වැඩසටහන්

6.2.1.1. දිස්ත්‍රික්ක හා පළාත් අනුව 6-11 ශ්‍රේණිය දක්වා දක්වා ශිෂ්‍යත්ව බෙදීයාම 2021

6.2.2. අ.පොස. උසස් පෙළ ශිෂ්‍යාධාර වැඩසටහන

6.2.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර වැඩසටහන

6.2.4. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පාඨමාලා ආධාර වැඩසටහන

6.2.5. කුසලතා ප්‍රවර්ධන ණය ලබාදීම

6.2.6. 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම

6.3. රණවිරු දූ දරුවන් සඳහා පරිත්‍යාගශීලී මූල්‍යාධාර ලබාදීම

07. මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

7.1. හැඳින්වීම හා අරමුණ

7.2. 2021 වසර තුළ දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය

7.3. 2021 වසර තුළ මාපිය කැපකරු ශිෂ්‍යත්ව ප්‍රතිලාභ බෙදී යාම

7.4. එක් එක් මාසයන් තුළ දී ලබා දුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය හා ඒ සඳහා දරන ලද පිරිවැය

7.5. මා පිය කැපකරු ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද සමාජ මෙහෙවර

7.5.1. බෞද්ධයා නාලිකාව සමග එක්ව රණවිරු දු දරුවන්ගේ වෙත ටැබ් යන්ත්‍ර ලබා දීම.

7.5.2. ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ භාරකරුවන්හට ස්වයං රැකියා සඳහා ආධාර ලබා දීම

08. පළාත් හා විශේෂ ව්‍යාපෘති අංශය

8.1. හැඳින්වීම

8.2. හදිසි ආපදා ආධාර ලබා දීමේ වැඩසටහන

8.2.1. ස්වභාවික ආපදාවන්ට ලක් වූ රණවිරු පවුල් වෙත ආධාර ලබා දීම

8.2.2. හදිසි අභාවයන්ට ලක් වූ රණවිරුවන් වෙනුවෙන් ආධාර ලබා දීම

8.3. රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

8.3.1. දීප ව්‍යාප්ත රණවිරු ගම්මාන

8.3.2. 2021 වර්ෂය තුළ රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

රණවිරු දරුවන් වෙනුවෙන් සංස්කෘතික කලායතනයක් ආරම්භ කිරීම

8.3.2.3. කලවාන රණවිරු ගම්මානය සඳහා ජල ටැංකියක් ලබා දීම

8.3.2.4. "විරු සහන" රණවිරු ගම්මානය සඳහා සංගීත භාණ්ඩ ලබා දීම

09. රණවිරු අනුස්මරණ වැඩසටහන

9.1. හැඳින්වීම

9.2. ජාතික රණවිරු දින සැමරුම් උත්සවය

9.3. මයිලපිටිය රණවිරු අනුස්මරණ උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු

9.3.1. 2021 වර්ෂය තුළ මයිලපිටිය උද්‍යානයේ නඩත්තු කටයුතු සිදු කිරීම

10. විශ්‍රාමික රණවිරු සුභසාධන අංශය

10.1. හැඳින්වීම

10.2. කාබනික පොහොර නිෂ්පාදනයට රණවිරුවන් යොමු කිරීමෙහි සැලසුම් සකස් කිරීම

10.2.1. රණබිමෙන් ගොවිබිමට - සරුපසේ පෙරළිය" කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

10.2.1.2. අනුරාධපුර දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

10.2.1.2. මාතර දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

10.2.1.3. ගාල්ල දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන

10.2.1.4. ගම්පහ දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

10.2.1.5.අනුරාධපුර දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

10.2.1.6. කළුතර දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

10.2.1.7. මාතලේ දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

10.3. මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම

10.3.1. මී මැසි පෙට්ටි සහ උපකරණ රණවිරු පවුල් වෙත ලබා දීමේ වැඩසටහන

10.3.1.1.අම්පාර දිස්ත්‍රික් මී මැසි පාලනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන

10.3.1.2. ගලිගමුව මී මැසි පාලනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන

10.3.2. එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා ලබා දුන් මී මැසි පෙට්ටි ප්‍රමාණයන්

10.4. අම්පාර දිස්ත්‍රික් කාබනික පොල් වගාව පිළිබඳ විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන

10.5. රණවිරු ව්‍යාසායකයන් දිරිගැන්වමින් පවත්වන ලද විශේෂ අවුරුදු පොළ
10.6 . "හෙළවිරු ඩිජිටල් මෘදුකාංගය" හඳුන්වා දීමේ වැඩසටහන

11. මාපිය රැකවරණ ව්‍යාපෘතිය
11.1. හැඳින්වීම
11.2. 2021 වසර තුළ එක එක් මාසයන්ට අදාළව මාපිය රැකවරණ දීමනා ලබාදීම

12. විරුසර වරප්‍රසාද කාඩ්පත් අංශය
12.1. හැඳින්වීම
12.2. විරුසර කාඩ්පත් පිරිනැමීම පළමු අදියර
12.3. විරුසර කාඩ්පත් පිරිනැමීම දෙවන අදියර
12.4. 2021 වසර තුළ මුද්‍රණය කර ඇති විරුසර වරප්‍රසාද කාඩ්පත් ප්‍රමාණය
12.5. විරුසර කාඩ්පත සඳහා වරප්‍රසාද ලබාදෙන ආයතන
12.6. විරුසර කාඩ්පත් ප්‍රතිලාභීන් සඳහා INSEE සිමෙන්ති ආයතනය මගින් සහන මිලක් යටතේ සිමෙන්ති ලබා දීම

ක්‍රියාත්මක ව්‍යාපෘති හා වැඩසටහන්

2021

01

රණක්ෂිතයට පත් රණවිරුවන් පුනරුත්ථාපනය සහ පසුඋවටැන

1.1.හැඳින්වීම

ක්‍රියාන්විත රාජකාරී කටයුතුවල නිරතවීම නිසා රණක්ෂිතයට පත්ව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වා ඇති රණවිරුවන් පුනරුත්ථාපනය හා පසුඋවටැන් කටයුතු මගින් රැක බලාගැනීම රණවිරු සේවා අධිකාරියේ ප්‍රමුඛ කාර්යභාරයකි. රණක්ෂිතයටපත් රණවිරුවන් කායිකව සහ මානසික සහ සමාජීය වශයෙන් සවිබල ගැන්වීම හා ඔවුන් අභිප්‍රේරණය කොට සමාජගත කරමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමකින් පවත්වා ගැනීමට අවැසි කටයුතු ඉටුකිරීම මෙම ව්‍යාපෘතීන් මගින් ඉටුකරනු ලබයි.

1.2. රණක්ෂිතයට පත් රණවිරුවන් සඳහා සහායක උපකරණ ලබාදීමේ වැඩසටහන

ක්‍රියාන්විතයේ දී රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ දෛනික ක්‍රියාකාරකම් අපහසුවකින් තොරව පවත්වා ගැනීම සඳහා සහායක උපකරණ භාවිතා කරනු ලබයි. මෙම උපකරණ තාක්ෂණික වශයෙන් ඉහළ ගුණාත්මක තත්ත්වයක පැවතීම රණවිරුවාගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් මට්ටමකින් පවත්වා ගෙන යාමට ඉවහල් වේ.

ඒ අනුව රණක්ෂිතයටපත් රණවිරුවන්ගේ දුබලතාවය මගහරවා ගැනීමට ඉවහල්වන කෘත්‍රිම පාද, කෘත්‍රිම අත්, රෝද පුටු, අත්වාරු, කිහිළිකරු, මූත්‍රා බෑග්, උපැස්, සායනික සපත්තු, ශ්‍රවණ උපකරණ, සුදු සැරයටි, බස්තම්, කොමඩ් පුටු, රෝහෝ කුෂන්, වායු මෙට්ට, ජෙල් මේස්, ජෙල් ලයිනර්, විද්‍යුත් ආරෝපිත යතුරු පැදි සහ වෙනත් සහායක උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබයි.

රණක්ෂිතයටපත් රණවිරුවාගේ අවශ්‍යතාවය පරිදි සහායක උපකරණ අඛණ්ඩව නොලැබීම සහ රණක්ෂිතයටපත් රණවිරුවන් ප්‍රශස්ත මට්ටමේ නොවන අබලන් වූ සහායක උපකරණ භාවිත කිරීම නිසා අතුරු ආබාධවලට ලක් වීම මග හැරීම උදෙසා අවශ්‍ය සහායක උපකරණ ලබාදීම මෙහි අරමුණයි. 2021 වසරේ දී නව ක්‍රමවේදයක් යටතේ **සහායක උපකරණ** ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක වන ලදී.



නව ක්‍රමවේදයක අවශ්‍යතාවය මතුවීම

සහායක උපකරණ ඉල්ලීම් යොමුකිරීම සඳහා වඩාත් කාර්යක්ෂම සහ විනිවිදභාවයකින් යුත් නව ක්‍රමවේදයක අවශ්‍යතාවය හඳුනා ගනිමින් මාර්ගගත ක්‍රමවේදයකට යොමුවීම

නව ක්‍රමවේදය හඳුන්වාදීම

පළාත් භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ දිස්ත්‍රික් භාර වැඩසටහන් නිලධාරීන් වෙත නව ක්‍රමවේදය හඳුන්වා දීම සහ අයදුම්පත් දිස්ත්‍රික්ක වෙත නිකුත් කිරීම

උපකරණ අවශ්‍යතාවය නිවරදිව හඳුනාගැනීම

අවශ්‍යතාවය හඳුනා ගැනීම සඳහා Google Form සහ Spreadsheet භාවිතයට ගැනීම හරහා නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ දිස්ත්‍රික් නිලධාරි නිර්දේශය මගින් ප්‍රමුඛතාගත කරන ලද අවශ්‍යතාවය හඳුනාගැනීම

උපකරණ ලබාදීම

නිර්ණායක මත පදනම්ව අවශ්‍යතා ඇගයීමක් සිදුකිරීම, එම අවශ්‍යතාවය සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හා රණවිරුවාගේ නිවස වෙතමට ගොස් උපකරණ ලබාදීම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරි විසින් සිදු කිරීම.

2021 වසරේ සේවාව අනුව සහායක උපකරණ අවශ්‍යතාවය ඉදිරිපත් කරන ලද රණවිරුවන් ප්‍රමාණය



1.3. 2021 වසර තුළ දිස්ත්‍රික් වශයෙන් සහායක උපකරණ සඳහා ඉල්ලීම් ලැබීම්

අනු අංකය	දිස්ත්‍රික්කය	ලැබී ඇති ඉල්ලීම් ප්‍රමාණය
01	කොළඹ	92
02	කලුතර	88
03	ගම්පහ	170
04	ගාල්ල	53
05	මාතර	95
06	හම්බන්තොට	95
07	මහනුවර	260
08	මාතලේ	146
09	නුවරඑළිය	98
10	අනුරාධපුර	291
11	පොළොන්නරුව	118
12	බදුල්ල	82
13	මොනරාගල	73
14	රත්නපුර	105
15	කෑගල්ල	113
16	අම්පාර	96
17	ත්‍රිකුණාමලය	16
18	මඩකලපුව	5
19	කුරුණෑගල	310
20	පුත්තලම	70
එකතුව		**2376**



රණක්ෂිතයටපත් රණවිරුවන්ගේ ක්‍රියශක්තිය හීන වීමේ ප්‍රතිශතය අනුව සහ වෙනත් බෝ නොවන රෝගවලට ගොදුරු වීම, වයස්ගතවීමේ දී ඇතිවන දුබලතාවන් හේතුවෙන් රණවිරුවන් විසින් සහායක උපකරණ කිහිපයක් භාවිතා කරනු ලබයි. ඒ අනුව රණක්ෂිතයටපත් රණවිරුවකු විසින් වසරකට උපකරණයකට කිහිපයක් සිය දුබලතාවය අවම කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන බව හඳුනාගත හැකිය.

උදා - කෘත්‍රිම පාද පළඳින රණවිරුවන් අත්වාරු භාවිතා කිරීම
රෝද පුටු භාවිතා කරන ඇතැමුන් අත්වාරු භාවිතා කිරීම
මූත්‍රා බෑග් භාවිත කරන්නන් වාර්ෂිකව බෑග් කිහිපයක් භාවිත කිරීම

එම නිසා රණක්ෂිතයටපත් රණවිරුවිරුවන්ගේ සහායක උපකරණ අවශ්‍යතාව රණක්ෂිතයට පත්ව විශ්‍රාම ගන්වන ලද රණවිරුවන්ගේ සංඛ්‍යාවට වඩා ඉහළ අගයක් ගනී. ඒ අනුව වර්ෂ 2021 වසර සඳහා සහායක උපකරණ වශයෙන් ඉල්ලම් 6696ක් යොමු කර ඇත.

1.4. උපකරණ වශයෙන් රණවිරුවන් ඉල්ලීම් යොමු කිරීම - 2021



1.4.1. රෝද පුටු ලබාදීම

රණවිරුවන් 1041 විසින් රෝද පුටු ලබාදෙන ලෙසට ඉල්ලීම් කරන ඇත. මෙම ඉල්ලීම් කරන ලද රණවිරුවන් අතරින් නිර්ණායක මත පදනම්ව දැනට භාවිතා කරන රෝද පුටුව අබලන් (කැඩී බිඳී /ඉරී/තැලී/මල බැඳුණු) තත්ත්වයේ පවතින සහ රෝගාතුරවීමක් මත හදිසි අවශ්‍යතාවයක් (හදිසි සැත්කම්, අනතුරු, කායික දුබලතා) මතු වී ඇති රණවිරුවන් සඳහා සමාන්‍ය රෝදපුටු 329ක් සහ කොමඩ් රෝද පුටු 23 ක් ලබාදෙන ලදී.

ඉදිරියේ දී සාමාන්‍ය රෝද පුටු 13ක් සහ කොමඩ් රෝදපුටු 2ක් සහ මෝටිවේෂන් රෝදපුටු 80 රණවිරුවන් වෙත ලබාදීමට නියමිතය.



1.4.1.1.පළාත් වශයෙන් රෝදපුටු ලබාදීම



1.4.2. අත්වාරු ලබාදීම

රණවිරුවන් 1500ට අධික ප්‍රමාණයක් අත්වාරු ඉල්ලීම් කර ඇති අතර එම රණවිරුවන් අතරින් ප්‍රතිලාභීන් 1000ක් සඳහා මේ වන විට අත්වාරු 2000ක් ලබා දී ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	අත්වාරු ප්‍රමාණය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
01	කලුතර	74	37
02	ගම්පහ	80	40
03	ගාල්ල	96	48
04	මාතර	130	65
05	නුවරඑළිය	434	217
06	අනුරාධපුර	168	84
07	පොළොන්නරුව	122	61
08	බදුල්ල	110	55
09	මොනරාගල	150	75
10	කෑගල්ල	110	55
11	අම්පාර	2	1
12	මඩකලපුව	20	10
13	කුරුණෑගල	96	48
14	පුත්තලම	408	204
එකතුව		**2000**	**1000**



1.4.3. කිහිලිකරු ලබාදීම

2021 වර්ෂය තුළ දී රණක්ෂිතයටපත් රණවිරුවන් 61 දෙනකු සඳහා කිහිලිකරු යුගලය බැගින් ලබා දී ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
01	කොළඹ	1
02	ගම්පහ	6
03	කළුතර	2
04	ගාල්ල	4
05	මාතර	4
06	හම්බන්තොට	6
07	මහනුවර	3
08	මාතලේ	2
09	නුවරඑළිය	1
10	කුරුණෑගල	4
11	පුත්තලම	1
12	අනුරාධපුර	15
13	පොළොන්නරුව	4
14	බදුල්ල	1
15	මොණරාගල	1
16	රත්නපුර	1
17	කෑගල්ල	2
18	අම්පාර	2
19	ත්‍රිකුණාමලය	1
එකතුව		61





1.4.5. කොමඩ් පුටු ලබාදීම

රණක්ෂිතයටපත් රණවිරුවන් 191 දෙනකු සඳහා කොමඩ් පුටු ලබා දී ඇති අතර ඉදිරියේ දී කොමඩ් පුටු 09ක් ලබාදීමට නියමිතය.





1.4.6. විද්‍යුත් ආරෝපිත යතුරු පැදි ලබාදීම

සාම්ප්‍රදායික පුනරුත්ථාපන ක්‍රමවේදය යටතේ වසර ගණනාවක සිටම රණවිරු සේවා අධිකාරිය විසින් රණවිරුවන් වෙත රෝදපුටු ලබාදීම සිදුකරනු ලබයි. පූර්ණ ආබාධිත රණවිරුවන් වෙත රෝදපුටු ලබාදීම මගින් ඔවුන් ගෘහස්ථ සීමාවේ දෛනික කටයුතු සඳහා සංචරණ අවකාශය හිමිකර ගනී. මෙම සාම්ප්‍රදායික පුනරුත්ථාපන ක්‍රමවේදයෙන් ඔබ්බට ගොස් රණවිරුවාට විවිධ අවස්ථාවන්හි ක්‍රියාකාරකම් සඳහා සහභාගීවීමට ඇති සංචරණ අවස්ථා ඇති කිරීමට සහ සමාජ සහභාගීත්වයට ඇති අවහිරතාවය මග හැරීමට ඉවහල් වන නව පුනරුත්ථාපන ක්‍රමවේදයක් යොදාගැනීම කෙරෙහි ගරුසභාපතිතුමාගේ අවධානය යොමු විය.



රණක්ෂිතයට පත් රණවිරුවන් ප්‍රධාන සමාජ ධාරවේ එදිනෙදා කටයුතුවල නිරත වීම උදෙසා සාමාන්‍යකරණය කිරීම කළ යුතුය. එහි දී සමාජ සංචරණයට ඇති අවස්ථාවන් ඇති කරදීම ඉතා වැදගත්ය. මේ සඳහා රෝදපුටු ලබාදීම වෙනුවට, සමාජ සංචරණයට සහ ප්‍රජා සබඳතා වර්ධනයට

ඉවහල් වන විද්‍යුත් ආරෝපිත යතුරු පැදියක් රණවිරුවා වෙත ලබාදීම හරහා රණවිරුවන් ඵලදායී, මානසික හා සමාජ ක්‍රියාකාරීත්වයෙන් යුත් පුද්ගලයන් බවට පත් කිරීම සඳහා බලගැන්වීමක් සිදුවේ.

විද්‍යුත් ආරෝපිත යතුරු පැදි ලබාදීම මගින් රණවිරුවන්ගේ ජීවිතය සැපවත් කිරීම, භෞතික පහසුකම් වර්ධනය කිරීම, ගුණාත්මක ජීවිතයක් ගතකිරීමට ඇති සමාජ සම්බන්ධතා ඇති කරගැනීමට අවස්ථා ළඟා කර දීම සහ ආර්ථික හා සමාජ වරණයන් සඳහා ඇති අවස්ථා වර්ධනය කිරීම හරහා ඔවුන් සමාජ ධාරාවෙන් බහිෂ්කරණයවීමට ඇති අවස්ථා අවම කර සාමාන්‍යකරණයට ලක් වේ. මෙය සෘජුව රණවිරුවා බලගැන්වීමට ද රණවිරු ප්‍රජාව සහ වක්‍රාකාරයෙන් පොදු සමාජය කෙරෙහි ද ධනාත්මක බලපෑම් කරනු ලැබේ.

ගරු සභාපතිතුමාගේ සංකල්පයක් වශයෙන් විද්‍යුත් යතුරු පැදි ලබාදීමේ පළමු අදියර යටතේ මේ වනවිට රණවිරුවන් පනස්දෙනකු වෙත විද්‍යුත් ආරෝපිත යතුරු පැදි ලබා දී ඇත.

1.4.6.1. විශේෂිත යතුරු පැදි ලබාදීම දිස්ත්‍රික්ක වශයෙන්

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
01	කොළඹ	2
02	ගම්පහ	3
03	කළුතර	2
04	ගාල්ල	3
05	මාතර	3
06	හම්බන්තොට	2
07	මහනුවර	2
08	මාතලේ	3
09	නුවරඑළිය	1
10	කුරුණෑගල	6
11	පුත්තලම	2
12	අනුරාධපුර	5
13	පොළොන්නරුව	1
14	බදුල්ල	1
15	මොණරාගල	3
16	රත්නපුර	5
17	කෑගල්ල	2
18	අම්පාර	3
19	ත්‍රිකුණාමලය	1











විද්‍යුත් ආරෝපිත යතුරු පැදි බෙදා දීමේ විශේෂ අවස්ථා

1.4.7. බස්තම් ලබාදීම

රණක්ෂිතයටපත් රණවිරුවන් විශ්‍රාම ගන්වා වසර දහයකටත් අධික කාලයක් ගත වී ඇති බැවින් මෙම රණවිරුවන් වයස්ගතවීම, බෝ නොවන රෝගවලට ගොදුරුවීම හා හදිසි අනතුරුවලට මුහුණදීම නිසා බස්තම් අවශ්‍යතාවයන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව රණවිරුවන් 135 දෙනකු විසින් බස්තම් ඉල්ලීම් සිදුකර ඇති අතර මේ වනවිට රණවිරුවන් 39 දෙනකු සඳහා බස්තම් ලබාදී ඇති අතර 2022 වර්ෂය තුළ දී රණවිරුවන් 96 දෙනකු සඳහා බස්තම් ලබාදීමට නියමිතය.





1.4.8. වායු මෙට්ට ලබාදීම

2021 වර්ෂය තුළ පූර්ණ ආබාධිත රණවිරුයන් හය දෙනකු සඳහා වායු මෙට්ට ලබා දී ඇත.





1.5. 2020 වසරේ දී මිල දී ගත් සහායක උපකරණ ලබාදීම

2020 වසරේ දී මිල දී ගත් සහායක උපකරණ රණවිරුවන් වෙත ලබාදීම 2021 වසරේ මුල් කාර්තු දෙක තුළ දී සිදුකරන ලදී. ඒ අනුව සුදුසැරයටි 11, කිහිලිකරු යුගල 18, කොමඩ් රෝදපුටු 22, මෝටිවේෂන් රෝදපුටු 29, සාමාන්‍ය රෝදපුටු 34, ශ්‍රවණාධාර 09, උපැස් යුගල 95, අත්වාරු 420 ලබාදෙන ලදී.



1.6. පරිත්‍යාගශීලී ආධාර මගින් ලද සහායක උපකරණ ලබාදීම

රණවිරු සේවා අධිකාරියේ හිටපු අධ්‍යක්ෂකවරයකු වන බ්‍රිගේඩියර් විජිත් සුබසිංහ (විශ්‍රාමික) මහතා විසින් ජර්මනියේ වෙසෙන ශ්‍රී ලාංකිකයෙකු වන අයිවර් වැන්කියුලන්බර්ග් මහතාගෙන් සිදු කරන ලද ඉල්ලීමකට අනුව කැලණි කේබල්ස් සමාගමේ අධ්‍යක්ෂ ප්‍රධාන විධායක මහින්ද සරණපාල මහතාගේ සම්බන්ධීකරණය සහ අනුග්‍රහය මත ජර්මනියේ සිට මෙරටට ගෙනා රුපියල් මිලියන 05 පමණ වටිනා සෞඛ්‍යය උපකරණ හා ආබාධිත සහායක උපකරණ ප්‍රදානය කරන ලදී. එම සෞඛ්‍යය හා ආබාධිත සහායක උපකරණ රණක්ෂිතයටපත් රණවිරුවන් සහ රණවිරු ළඟම ඥාතීන් වෙත ලබාදීම සිදුකරන ලදී. මීට අමතරව දේශීය පරිත්‍යාගශීලී ආධාර යටතේ රණක්ෂිතයටපත් රණවිරුවන් දහතුන් දෙනකු සඳහා කෘත්‍රිම පාද ලබාදීම සිදුකරන ලදී.





පරිත්‍යාගශීලීන් මගින් ලැබුණු උපකරණ



1.7. 2021 වර්ෂය සඳහා සමස්ත උපකරණ ලබාදීම

වර්ෂ 2021 සඳහා ආබාධිත සහායක උපකරණ ලබාදීමේ වැඩසටහන යටතේ උපකරණ වර්ග 5540ක් ලබාදීමට නියමිත වූ අතර රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා භාණ්ඩ මිල දී ගැනීම් සිදුකරනු ලබන ආයතනයන්හි උපකරණ සංචිත නොමැති වීම සහ එම උපකරණ ආනයනය කිරීම සඳහා කාලය ගත වීම හේතුවෙන් භාණ්ඩ මිල දී ගැනීමේ කටයුතු ප්‍රමාදවීමකට ලක්විය.

ඒ අනුව ඉදිරියේ දී කෘත්‍රිම පාද, කෘත්‍රිම අත් , සායනික සපත්තු, ශ්‍රවණාධාර, උපැස්, ජෙල්මේස්, ජෙල් ලයිනර්, රණක්ෂිතයටපත් රණවිරුවන් සඳහා ලබාදීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ.

2021 වසරේ දී මිල දී ගත් උපකරණ 2021.12.31 දිනට දිස්ත්‍රික්ක වශයෙන් බෙදා දීම



1.8. කෘත්‍රිම පාද සැකසීම සඳහා මිනුම් ලබා ගැනීමේ වැඩමුලු පැවැත්වීම

කෘත්‍රිම පාද සැකසීම සඳහා රණවිරුවන් 250 දෙනකුගේ මිනුම් ලබාගැනීම සඳහා මාතර, මහනුවර, කුරුණෑගල, රත්නපුර,අනුරාධපුර සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි දී වැඩසටහන් පවත්වන ලදී. ඒ අනුව සකස් කරන ලද කෘත්‍රිම පාද 152ක් පහත පරිදි දිස්ත්‍රික්ක වෙත යොමු කර ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
01	අනුරාධපුර	26
02	අම්පාර	8
03	කළුතර	1
04	කෑගල්ල	9
05	කුරුණෑගල	33
06	කොළඹ	2
07	ගම්පහ	9
08	ගාල්ල	2
09	නුවරඑළිය	2
10	පුත්තලම	5
11	පොළොන්නරුව	4
12	බදුල්ල	8
13	මහනුවර	10
14	මාතර	4
15	මාතලේ	4
16	මොණරාගල	5
17	රත්නපුර	11
18	හම්බන්තොට	8

රණවිරු සෙවණ රාගම සහ එහි ශාඛාවන් වන කුරුණෑගල පාන්ගොල්ල අභිමංසල, වැල්ලවාය , ගාල්ල සැනසුම, අනුරාධපුර අභිමංසල යන ස්ථාන වලදී ද රණවිරුවන් 427 දෙනකුගේ මිනුම් ලබා ගැනීම සිදු කර ඇත.















කෘත්‍රිම පාද සකස් කිරීමේ වැඩසටහන්වල විශේෂ අවස්ථා

1.9. පළාත් හා දිස්ත්‍රික් වශයෙන් උපකරණ ලබාදීම

බස්නාහිර පළාත




කොළඹ දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





ගම්පහ දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





කලුතර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

මධ්‍යම පළාත





මාතලේ දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





මහනුවර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





නුවරඑළිය දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

දකුණු පළාත





ගාල්ල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





මාතර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





හම්බන්තොට දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

වයඹ පළාත




කුරුණෑගල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම




පුත්තලම දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

උතුරු මැද පළාත




අනුරාධපුර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

උඟව පළාත





බදුල්ල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





මොනරාගල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

සබරගමුව පළාත




රත්නපුර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම




කෑගල්ල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

නැගෙනහිර පළාත




අම්පාර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





ත්‍රිකුණාමලය/මඩකලපුව දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

02

රණක්ෂිතයටපත් රණවිරුවන්ගේ නිවාසයන්හි සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

2.1. හැඳින්වීම

ශ්‍රී ලංකා සමාජය තුළ සෑම නිවසක් සතුවම පෞද්ගලික වැසිකිළි පහසුකම් පවතී. නමුත් මෙම වැසිකිළි පහසුකම් සකසා ඇත්තේ සාමාන්‍ය නිරෝගී පුද්ගලයකුගේ භාවිතාව සඳහා සරිලන පරිදිය. බහුතරයක් රණවිරු නිවාසවල මෙම වැසිකිළි පහසුකම් ආබාධිත රණවිරුවාගේ ආබාධිතතාවයට සරිලන හා ගැළපෙන පරිදි සකස් කර නොමැති බව හඳුනාගත හැකිය. ක්‍රියාන්විතයේ දී කායික දුබලතාවයට පත් රණවිරුවන්ගේ භාවිතයට සුදුසු වන පරිදි මෙම සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය වී නොමැති බව ක්ෂේත්‍ර නිරීක්ෂණයන්වල දී අනාවරණය වූ කරුණකි.

එවැනි පහසුකම් වලින් තොර සනීපාරක්ෂක පහසුකම් දෛනිකව භාවිතා කිරීම හේතුවෙන් රණවිරුවාගේ කායික දුබලතාවයට සෘණාත්මක බලපෑමක් ඇති කරයි. සනීපාරක්ෂක කටයුතු වල දී රණවිරුවන් ඒ සඳහා පහසුවන අයුරින් වෙනත් ආදේශක සහයක ආධාරක භාවිතා කිරීමට ද යොමු වී ඇත. මේ නිසා සිය ආබාධිතතාවය පිළිබඳව රණවිරුවා මානසික පසුබෑමකට ලක්වන අතර රණවිරු ඥාතීන් ද අපහසුතාවයට ලක් වේ.

එබැවින් ආබාධිත රණවිරුවන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආබාධිත තත්ත්වයට උචිත පරිදි සෞඛ්‍යාරක්ෂිත නාන කාමරයක් ඉදි කර ගැනීම වෙනුවෙන් මූල්‍ය ආධාර පිරිනැමීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරයි.

ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන් සඳහා දැනට පවතින සනීපාරක්ෂක පහසුකම් සිය ආබාධිත තත්වයට සරිලන පරිදි කොමඩ් පහසුකම් සහිත නාන කාමරයක් ලෙස ඉදිකිරීම සඳහා රු.100,000/- ක මූල්‍ය ආධාරයක් හා රණවිරු සේවා අධිකාරිය මගින් සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කරගැනීම සඳහා වසර 10 කට පෙර මූල්‍ය ආධාර ලබාදුන් රණවිරුවන් සඳහා අලුත්වැඩියා කටයුතු කරගැනීමට රු.50,000/- ක මූල්‍ය ආධාරයක් ලබාදීම මේ යටතේ සිදු වේ.

2.2. සනීපාරක්ෂක ආධාර මුදල් ලබාදීමේ ක්‍රමවේදය



2.3. දිස්ත්‍රික්ක වශයෙන් සනීපාරක්ෂක ආධාර ලබාදීම

2021 වසර සඳහා රණවිරුවන් 306ක් සනීපාරක්ෂක මුදල් ඉල්ලීම් කර ඇත. එම අයදුම්පත් අතරින් නිර්ණායක මත පදනම්ව රණවිරුවන් 121 සඳහා මූල්‍ය ආධාර ලබාදී ඇත. ඉදිරි වසරේ දී අනෙකුත් ඉල්ලීම් සඳහා මුල්‍ය ආධාර ලබාදීමට නියමිතය.

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	අනුරාධපුර	5
02	අම්පාර	7
03	කලුතර	3
04	කෑගල්ල	4
05	කුරුණෑගල	12
06	කොළඹ	3
07	ගම්පහ	1
08	ගාල්ල	5
09	නුවරඑළිය	13
10	පොළොන්නරුව	3
11	බදුල්ල	1
12	මහනුවර	22
13	මාතර	2
14	මාතලේ	25
15	මොනරාගල	7
16	රත්නපුර	5
17	හම්බන්තොට	3



2.4. සනීපාරක්ෂක ආධාර ලබාදීමේ ප්‍රගතිය

අනු අංකය	ආධාරයේ ස්වභාවය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	නව ඉදිකිරීම්	89
02	අලුත් වැඩියා කිරීම්	15
03	දෙවන වාරික ගෙවීම්	17



2.5. සනීපාරක්ෂක ආධාර ලබාදීමට පෙර හා පසු තත්වයන්ගේ ඡායාරූප



පෙර තත්ත්වය හා පසු තත්ත්වය




පෙර තත්ත්වය හා පසු තත්ත්වය




පෙර තත්ත්වය හා පසු තත්ත්වය

03

ක්‍රීඩා අංශය

3.1. හැඳින්වීම

රණවිරු ප්‍රජාව වෙත සුභසාධන කටයුතු සැලසීමේ දී ඔවුන් වෙත වඩාත් සමීප විය හැකි ක්‍රමවේදයක් ලෙස ක්‍රීඩාව හැඳින්විය හැකිය. ආබාධිත විශ්‍රාමික රණවිරුවන් බහුතරයක් තුළ ඔවුන් යුද බිමේ දී පුරුදු පුහුණු කළ කෞශල්‍යයන් ගැබ් වී ඇති බැවින් ක්‍රීඩාව යනු ඔවුනට වඩාත් සමීප විය හැකි මාර්ගයකි.

පශ්චාත් යුදමය මානසිකත්වයෙන් සිටින රණවිරු ප්‍රජාව කායික හා මානසික වශයෙන් සවිබල ගැන්වීමෙහිලා වඩාත් ප්‍රායෝගිකව ක්‍රමවේදයක් වශයෙන් ක්‍රීඩාව උපයෝගී කර ගැනීමට හැකිය. ආබාධිතභාවය බාධාවක් කර නොගනිමින් රණවිරුවන්ගේ දක්ෂතා වැඩිදියුණු කිරීම, රණවිරු පවුල් සාමාජිකයන්ගේ ක්‍රීඩා දක්ෂතා හඳුනාගෙන ඔවුන් ක්‍රීඩාව වෙත යොමු කිරීම තුළින් රණවිරුවන්ට වටිනාකමක් ලබා දීම හා ජාත්‍යන්තර තරග සඳහා සහභාගී කරවීම තුළින් ලාංකීය රණවිරුවන්ට අභිමානයක් ලබා දීම රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා අංශය මගින් සිදු කරයි.

3.2. 2021 වර්ෂය තුළ ක්‍රීඩා අංශය මගින් අත් කර ගත් ජයග්‍රහණ

3.2.1. රණවිරු සේවා අධිකාරි බැඩ්මින්ටන් කණ්ඩායම ජාතික පැරා බැඩ්මින්ටන් තරගාවලියේ දී ජය හිමි කර ගැනීම

2021 ජාතික පැරා බැඩ්මින්ටන් තරගාවලිය 2021 දෙසැම්බර් මස එකොළොස් වන දින අනුරාධපුර ගෘහස්ථ ක්‍රීඩාගාරයේ දී පවත්වන ලදී. එහි දී විවිධ කාණ්ඩයන් යටතේ තරග 52 ක් පැවැත්වූ අතර ඒ සඳහා දිවයින පුරා පිහිටි ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් විවිධ ආබාධිත තත්ත්වයන් යටතේ සිටින ක්‍රීඩකයන් සියයකට අධික ප්‍රමාණයක් සහභාගි විය. රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් ජාතික පැරා බැඩ්මින්ටන් තරගාවලිය සඳහා සහභාගී වූ ක්‍රීඩකයන්ට විසින් කැපී පෙනෙන ජයග්‍රහණ කිහිපයක් අත්පත් කර ගන්නා ලදී.

රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් SU 5 කේවල කාණ්ඩයෙන් තරග වැදුණු කෝප්‍රල් ක්‍රිෂාන්ත HTG එම කාණ්ඩයේ ශූරතාවය හිමිකර ගැනීමට සමත් වූ අතර එම කාණ්ඩයෙන්ම තරග වැදුණු සැරයන් ප්‍රනාන්දු D විසින් එහි අනුශූරතාවය දිනා ගන්නා ගත්තේ ය.

SU5 යුගල කාණ්ඩයෙන් රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් තරග වැදුණු කෝප්‍රල් චන්දිමාල් GR සහ කෝප්‍රල් ක්‍රිශාන්ත HTG එහි ශූරතාවය හිමිකර ගන්නා ලද අතර එහි අනුශූරතාව සැරයන් ප්‍රනාන්දු විසින් හිමිකර ගන්නා ලදී.

මෙම ක්‍රීඩා කණ්ඩායමේ පුහුණුකරු වශයෙන් කටයුතු කරන ලද්දේ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් බැඩ්මින්ටන් තරග ජයග්‍රහණ රැසක් හිමිකරගෙන සිටින රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා කණ්ඩායම් භාර නිලධාරී මේජර් හිනිදුමගේ චන්දන විසිනි. මෙම ජයග්‍රහණය ජාතික පැරා ක්‍රීඩා තරගාවලියකදී රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා කණ්ඩායම ලද ප්‍රථම ජයග්‍රහණය වශයෙන් රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා ඉතිහාසයට එකතු වෙයි.






2021 ජාතික පැරා බැඩ්මින්ටන් තරගාවලියේ විශේෂ අවස්ථා

3.2.2. රණවිරු සේවා අධිකාරියේ බැඩ්මින්ටන් සංචිතය 69 වන ජාතික බැඩ්මින්ටන් තරගාවලියේ (para) තරග අංශයේ ජයග්‍රහණ අත්පත් කර ගැනීම

2021.12.15 සිට 19 දින දක්වා කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රීඩාගාරයේ දී පැවැති 69 වන ජාතික බැඩ්මින්ටන් ශූරතාවලියේ දී ප්‍රථම වරට සංවිධානය කරන ලද ආබාධිත කාණ්ඩයේ (Para) බැඩ්මින්ටන් තරගාවලියේ SU5/SL4 කේවල හා යුගල තරග සඳහා රණවිරු සේවා අධිකාරි බැඩ්මින්ටන් කණ්ඩායම නියෝජනය කරමින් ක්‍රීඩකයන් සහභාගී විය.

මෙහි දී රණවිරු සේවා ක්‍රීඩා කණ්ඩායම නියෝජනය කරමින් SU5 කාණ්ඩයේ කේවල කාණ්ඩය යටතේ තරග වැදුණු ගිහාන් ක්‍රිෂාන්ත HT එහි ශූරතාවය දිනාගත් අතර ප්‍රනාන්දු D විසින් අනුශූරතාවය ලබා ගත්තේය.

SL4 කේවල කාණ්ඩය යටතේ තරග වැදුණු චන්දිමාල් GR විසින් අනුශූරතාවය හිමිකර ගැනීමට සමත් වූ අතර SU5 හා SL4 යුගල තරගවල දී රණවිරු සේවා අධිකාරියේ Badminton සංචිතය නියෝජනය කළ ගිහාන් ක්‍රිෂාන්ත සහ චන්දිමාල් යන ක්‍රීඩකයන් විසින් යුගල ශූරතාවය දිනා ගන්නා ලදී.

මෙම අවස්ථාව වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා කණ්ඩායම් භාර නිලධාරී හා බැඩ්මින්ටන් පුහුණුකරු වන මේජර් හිනිදුමගේ චන්දන මහතා සහභාගි වන ලදී .



69 වන ජාතික බැඩ්මින්ටන් ශූරතාවලියේ විශේෂ අවස්ථා

3.2.3. ආසියානු පැරා මළල ක්‍රීඩා සංචිතයට රණවිරු සේවා අධිකාරිය වරම් ලැබීම

ජාතික පැරාලිම්පික් කමිටුව විසින් සංවිධානය කරන ලද 2022 වසරේ පැවැත්වීමට නියමිත ආසියානු පැරා මළල ක්‍රීඩා සංචිතය සඳහා සුදුසුකම් ලබන ක්‍රීඩකයන් තේරීමේ තරග 2021 ඔක්තෝම්බර් මස 26 වන දින කොළඹ සුගතදාස ක්‍රීඩා පිටියේ දී පැවැත්විණි.

එහි දී 2022 ආසියානු පැරා මළල ක්‍රීඩා තරග සංචිතය සඳහා සුදුසුකම් ලැබීමට රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය නියෝජනය කරමින් T- 42 කාණ්ඩය යටතේ මීටර් 100 සහ 200 යන ඉසව් සඳහා තරග වැදුණු විශ්‍රාමික සාජන් මේජර් වයි.ඒ. අනිල් ප්‍රසන්න ජයලත් සුදුසුකම් ලබා ඇත.

3.2.4. රණවිරු සේවා මළල ක්‍රීඩා සංචිතයේ ක්‍රීඩකයින් ආසියානු පැරා දෙවන තේරීම් තරගවල දී සුදුසුකම් ලැබීම

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී පවත්වන ලද පැරා ආසියානු දෙවන වටයේ තේරීම් තරග සඳහා ඉදිරිපත් වූ රණවිරු සේවා අධිකාරියේ මළල ක්‍රීඩා සංචිතය නියෝජනය කරන වයි.පී.ඒ.පී ජයලත් සහ ඒ.එම්.ඒ අත්තනායක යන ක්‍රීඩකයන් මීටර් 100 සහ 200 තරග සඳහා සුදුසුකම් ලබා ගැනීමට සමත් විය.

මෙහි දී T 42 කාණ්ඩයෙන් තරග වැදුණු වයි.පී. අනිල් ප්‍රසන්න ජයලත් මීටර් 100 සහ 200 තරගවලින් සුදුසුකම් ලැබූ අතර ආසියානු පැරා ක්‍රීඩා උළෙලේ දෙවන තේරීම් තරග වටයේදී සුදුසුකම් ලැබූ අතර T46/ T47 කාණ්ඩයෙන් තරග වැදුණු ඒ.එම්.ඒ අත්තනායක මීටර් 200 තරගය සඳහා සහභාගි වී ආසියානු පැරා මලල ක්‍රීඩා තරගාවලියේ දෙවන වටයේ තේරීම් තරගවලින් සුදුසුකම් ලැබීය.






ආසියානු පැරා මළල ක්‍රීඩා සංවිතයට සුදුසුකම් ලැබූ ක්‍රීඩකයින් රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා අංශය භාර නිලධාරීතුමා සමග

3.3. 2021 වර්ෂය තුළ ක්‍රීඩා අංශය මගින් සිදු කරන ලද වෙනත් වැඩසටහන්

3.3.1. ජාතික පැරා බැඩ්මින්ටන් තරගාවලියේ ජයග්‍රාහකයන් ඇගයීමට ලක් කිරීම

2021.12.11 වන දින අනුරාධපුර ගෘහස්ථ ක්‍රීඩාගාරයේ දී පැවති 2021 ජාතික පැරා බැඩ්මින්ටන් ක්‍රීඩා තරගාවලිය සඳහා රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් ක්‍රීඩා රණවිරු සේවා අධිකාරිය වෙත ගෞරවයක් අත් කර දුන් ක්‍රීඩකයන් ඇගයීමේ උත්සවයක් රණවිරු සේවා අධිකාරියේ දී පවත්වන ලදී.

ජාතික පැරා බැඩ්මින්ටන් තරගාවලිය සඳහා රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් SU 5 කේවල කාණ්ඩයෙන් තරග වැදී ශූරතාවය හිමි කර ගත් කෝප්‍රල් ක්‍රිෂාන්ත, එම කාණ්ඩයෙන්ම තරග වැදී එහි අනුශූරතාවය දිනාගත් සැරයන් ප්‍රනාන්දු, SU5 යුගල කාණ්ඩයෙන් තරග වැදී ශූරතාවය හිමිකර ගත් කෝප්‍රල් චන්දිමාල් සහ කෝප්‍රල් ක්‍රිශාන්ත සහ එහි අනුශූරතාව දිනා ගත් සැරයන් ප්‍රනාන්දු යන ක්‍රීඩකයන් මෙහි දී ඇගයීමට ලක් විය.

රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) ඇතුළු නිලධාරීන් මෙම ක්‍රීඩකයන් ඇගයීම සඳහා සහභාගී විය



ජයග්‍රාහී ක්‍රීඩකයන් ඇගයීමට ලක් කිරීමේ විශේෂ අවස්ථා

3.3.2. රණවිරු සේවා ක්‍රීඩා සංචිතයේ ක්‍රීඩකයන් හට විශේෂ ක්‍රීඩා උපකරණ පරිත්‍යාග කිරීම

පසුගිය වසරේ රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය නියෝජනය කරමින් විශේෂ දක්ෂතා හිමිකරගත් මලළ ක්‍රීඩකයන් දෙදෙනකුට සහ බැඩ්මින්ටන් ක්‍රීඩකයන් තිදෙනෙකු සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ සහ විශේෂ විටමින් සහ ප්‍රෝටීන් අඩංගු ශක්ති ජනක පානයන් ලබාදීමේ විශේෂ වැඩසටහනක් වැනි දින රණවිරු සේවා අධිකාරියේ දී පවත්වන ලදී.

රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමන් ඇතුළු නිලධාරීන් හා රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතයේ ක්‍රීඩකයින් මෙම අවස්ථාව සඳහා සහභාගී වූ අතර සභාපතිතුමා විසින් ක්‍රීඩකයන් මුහුණ දෙන ගැටලු හා අභියෝග පිළිබඳව සාකච්ඡා කරමින් සුහද පිළිසඳරක් ද පැවැත්වීය.









ක්‍රීඩකයන්හට ක්‍රීඩා උපකරණ සහ විශේෂ ශක්ති ජනක පානයන් ලබාදීමේ අවස්ථාව

3.3.3. මහනුවර දිස්ත්‍රික්කයේ "රණවිරු උයන" රණවිරු ගම්මානයට ක්‍රීඩා උපකරණ බෙදා දීමේ වැඩසටහන

රණවිරු ගම්මානවල ජීවත්වන රණවිරු පවුල්වල ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් රණවිරු පවුල් සඳහා ක්‍රීඩා උපකරණ බෙදා දීමේ වැඩසටහන යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ "රණවිරු උයන" රණවිරු ගම්මානය වෙත ක්‍රීඩා උපකරණ බෙදා දීම මහනුවර "රණවිරු උයන" රණවිරු ගම්මානයේ දී සිදු කරන ලදී.

මෙම අවස්ථාව සඳහා රණවිරු සේවා අධිකාරියේ මධ්‍යම පළාත භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ ගුණදාස හේමචන්ද්‍ර මහතා සහ මහනුවර දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරී අජන්තා හේරත් මෙනවිය සහභාගී විය.




3.3.4. හම්බන්තොට දිස්ත්‍රික්කයේ රණවිරු ගම්මාන සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ බෙදා දීම

රණවිරු ගම්මානවල ජීවත්වන රණවිරු පවුල්වල ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් රණවිරු පවුල් සඳහා ක්‍රීඩා උපකරණ බෙදා දීමේ වැඩසටහන යටතේ දියත් කෙරුණු තවත් වැඩසටහනක් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවැත්විණි.

හම්බන්තොට අතිරේක දිස්ත්‍රික් ලේකම් ජේ.එච්.එස් ජයමහ මහතා, සහකාර දිස්ත්‍රික් ලේකම් කේ චන්දිමා නිරෝෂනී මහත්මිය, රණවිරු සේවා අධිකාරියේ හම්බන්තොට දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරී, චාලක නුවන් මහතා සහ රණවිරු සංසදවල සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් මෙම ක්‍රීඩා උපකරණ බෙදා දීම සිදු කරන ලදී.





ක්‍රීඩා භාණ්ඩ බෙදා දීමේ විශේෂ අවස්ථා

3.3.5. කළුතර දිස්ත්‍රික්කයේ රණවිරු ගම්මාන සඳහා ක්‍රීඩා උපකරණ බෙදා දීම

රණවිරු ගම්මානවල ජීවත්වන රණවිරු පවුල්වල ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් රණවිරු පවුල් සඳහා ක්‍රීඩා උපකරණ බෙදා දීමේ වැඩසටහන යටතේ මිල්ලැව කිදෙල්පිටිය රණවිරු ගම්මානය සහ දොඹගොඩ රණවිරු ගම්මානයන් වෙත ක්‍රීඩා උපකරණ බෙදා දීම කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී සිදු කරන ලදී .

ක්‍රීඩා උපකරණ බෙදා දීම කලුතර අතිරේක දිස්ත්‍රික් ලේකම් තිලංකා වෙත්තසිංහ මහත්මියගේ රණවිරු සේවා අධිකාරියේ කලුතර දිස්ත්‍රික් නිලධාරී ගයේෂි ලක්ෂිකා මෙනවියගේ ප්‍රධානත්වයෙන් සිදු වූ අතර රණක්ෂිතයට පත් රණවිරුවන්, රණවිරු බිරින්දෑවරුන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් මෙම අවස්ථාව සඳහා සහභාගී විය.





04

නිවාස, යටිතල පහසුකම් සුභසාධන හා ව්‍යවසාය සංවර්ධන මාපිය සුරැකුම් ණය අංශය

4.1.හැඳින්වීම

රණවිරු සේවා අධිකාරිය මගින් සේවාව සපයන රණවිරු ප්‍රජාවෙහි නිවාස අවශ්‍යතාවය සපුරාලනු වස් නිවාස ණය හා ආධාර ලබා දීම, රණවිරු ව්‍යවසායකයක් සවිබල ගන්වමින් ස්වයං රැකියා ණය පහසුකම් ලබා දීම හා රණවිරු දෙමාපියන් වෙනුවෙන් ලබා දෙන මා පිය සුරැකුම් දීමනාව වෙනුවෙන් අවශ්‍ය කටයුතු ඉටු කිරීම ආදී රණවිරු සුභසාධන වැඩසටහන් රැසක් මෙම අංශය මගින් ඉටු කරනු ලබයි

4.2. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ රණවිරු සේවා අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන ‘‘විරු සුමිතුරු’’ ජාතික නිවාස ව්‍යාපෘතිය 2017 වර්ෂයෙන් ආරම්භව 2022 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිතය. ක්‍රියාන්විත රාජකාරියේ දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සහ ක්‍රියාන්විත රාජකාරියේ දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව, ඒ හේතුවෙන් විශ්‍රාම ගන්වන ලද ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තුමේන්තුව යන සන්නද්ධ හමුදාවල ක්‍රියාන්විත ප්‍රදේශයන්හි රාජකාරි කරමින් සිටිය දී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව දිවි පිදූ රණවිරුවන්ගේ අසරණභාවයට පත් ළඟම ඥාතියාට සහ ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරි කරමින් සිටිය දී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව ආබාධිත තත්ත්වයට පත් වූ ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ නිවාස අවශ්‍යතා සම්පූර්ණ කිරීම වෙනුවෙන් සහය සැලසීම, රණවිරුවන් විසින් සිදු කරන ලද සේවය ඇගයීම හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට රජයෙන් හා ජනතාවගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටු කිරීම හා රණවිරුවන්ගේ නිවාස ඉදිකිරීමේ සහ සම්පූර්ණ කිරීමේ ගැටලුවට රජය මැදිහත් වීම තුළින් තිරසාර ජාතික විසඳුමක් ලබා දීම යන අරමුණු ඉටු කිරීම වෙනුවෙන් විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය නිර්මාණය වී තිබේ.

විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 6 ක කාලයක් තුළ පූර්ණ නිවාස 450ක් හා අර්ධ නිවාස 4000ක් ඉදි කර අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය රු.මි. 3192 කි. පූර්ණ නිවාස සඳහා රු.1,200,000.00ක මුදලක් සමග ශ්‍රම දායකත්වය ද, අර්ධ නිවාස සඳහා රු. 500,000.00 ක මුදලක් ද ලබා දීම සිදු කෙරේ. මෙම මුදල මහා භාණ්ඩාගාරයෙන් හිමි වන අතර නිවාස සංවර්ධන අධිකාරිය මගින් ප්‍රතිලාභීන්හට මුදල් ලබා දෙයි.

4.2.1. විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය සඳහා රණවිරු සේවා අධිකාරියෙහි කාර්යභාරය

විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය නිවාස සංවර්ධන අධිකාරිය හා රණවිරු සේවා අධිකාරිය එක්ව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියකි. රණවිරු සේවා අධිකාරිය මගින් සතු ප්‍රධාන වගකීම වන්නේ සුදුසු ප්‍රතිලාභීන් තෝරා නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීමයි.

ඒ සඳහා රණවිරු සංසද නිර්දේශය, ග්‍රාම නිලධාරි , ප්‍රාදේශිය ලේකම් නිර්දේශය සහ දිස්ත්‍රික් හා පලාත් නිළධාරීන් නිර්දේශය සහිතව සම්පූර්ණ වූ අයදුම්පත ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ වූ අයදුම්පත් ව්‍යාපෘතිය මගින් අභ්‍යන්තරව පත් කරන ලද කමිටුව වෙත ඉදිරිපත් කර, කමිටු නිර්දේශ ලද අයදුම්පත් සඳහා අධ්‍යක්ෂකතුමාගේ හා සභාපතිතුමාගේ අනුමැතිය ලද පසු ආධාර මුදල් ලබා දීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත නාම ලේඛණයක් මගින් ලබා දීම සිදු කරයි.

නිවාස සංවර්ධන අධිකාරියෙන් මගින් වාරික 4 කින් ප්‍රතිලාභීන්ට ගෙවීම් කටයුතු කරනු ලැබේ. පූර්ණ නිවාස සඳහා ශ්‍රමය ලබා ගැනීම සඳහා රණවිරු සේවා අධිකාරිය මගින් ත්‍රිවිධ හමුදා වෙත ලිපි යොමු කරන අතර අවශ්‍ය වූ විට සැලැස්ම වෙනස් කිරීමට ද නිර්ණායකයන්ට යටත්ව අවසර ලබා දෙයි.

4.2.2. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කළ පූර්ණ නිවාස සහ අර්ධ නිවාස සංඛ්‍යාව

වර්ෂය	පූර්ණ නිවාස	අර්ධ නිවාස
2017	203	52
2018	106	1162
2019	25	741
2020	12	499
2021	29	121
එකතුව	**375**	**2575**



4.2.3. 2021 වර්ෂය තුළ නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලද ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක වශයෙන්

අනු අංකය	දිස්ත්‍රික්කය	පූර්ණ නිවාස	අර්ධ නිවාස
01	කොළඹ	1	4
02	ගම්පහ	-	3
03	කළුතර	1	4
04	කෑගල්ල	-	3
05	රත්නපුර	2	1
06	ගාල්ල	1	4
07	මාතර	1	10
08	හම්බන්තොට	-	5
09	අනුරාධපුර	-	5
10	පොළොන්නරුව	5	17
11	බදුල්ල	-	1
12	මොණරාගල	-	9
13	නුවරඑළිය	2	3
14	මහනුවර	8	15
15	මාතලේ	4	14
16	අම්පාර	-	2
17	ත්‍රිකුණාමලය	-	4
18	කුරුණෑගල	1	4
එකතුව		26	108






විරු සුමිතුරු ව්‍යාපෘතිය යටතේ ඉදි කරමින් පවතින, වැඩ නිම කළ හා පදිංචි වී ඇති නිවාස

4.3. "විරු සහන" නිවාස ණය වැඩසටහන

රණවිරු සංසදවල සිටින රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ නිවසක් ගොඩනගා ගැනීමේ සිහිනය සැබෑ කිරීමේ අරමුණින් යුතුව සහදායී පදනමක් මත සේවා ගාස්තුවක් පමණක් අයකරමින් රණවිරු සේවා අධිකාරිය විසින් "විරු සහන නිවාස ණය ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කර ඇත.

ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවය මත නව නිවසක් ඉදි කිරීම, නිවාස වැඩි දියුණු කර ගැනීම හා නිවාස අළුත්වැඩියා කර ගැනීම වෙනුවෙන් විරු සහන ණය ව්‍යාපෘතිය මගින් උපරිමය එක් අයෙකුට රු. 1,000,000.00ක ණය මුදල් ලබා දීම සිදු කරනු ලබයි.

ක්‍රියාන්විතයේ දී ජීවිත පුදකළ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හා ක්‍රියාන්විතයේ දී ආබාධිත විශ්‍රාමික රණවිරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහන 2021 වසර තුළ දී ආබාධිත රණවිරුවන් 206 දෙනෙකු හා රණවිරු ඥාතීන් 56දෙනෙකු වශයෙන් ප්‍රතිලාභීන් 262 දෙනෙකු සඳහා නිවාස ණය ලබා දෙමින් සාර්ථක ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

4.3.1 දිස්ත්‍රික්ක අනුව නිවාස ණය ලබාදීම

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	අම්පාර	7
02	අනුරාධපුර	15
03	බදුල්ල	17
04	කොළඹ	23
05	ගාල්ල	13
06	ගම්පහ	20
07	හම්බන්තොට	11
08	කළුතර	12
09	මහනුවර	34
10	කෑගල්ල	20
11	කුරුණෑගල	26
12	මාතර	10
13	මාතලේ	6
14	මොණරාගල	12
15	නුවරඑළිය	4
16	පොළොන්නරුව	10
17	පුත්තලම	7
18	රත්නපුර	15
එකතුව		262

4.3.2. 2021 නිවාස ණය ලබා දීම - පළාත් අනුව

අනු අංකය	පළාත	දිස්ත්‍රික්කය	සමස්ත ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් අතර මුදල් බෙදී ගිය ආකාරය							
				300,000	400,000	500,000	600,000	700,000	800,000	900,000	1,000,000
01	බස්නාහිර	කොළඹ	23	-	-	1	-	-	-	-	22
		ගම්පහ	20	-	-		-	1	1	-	18
		කළුතර	12	-	-	2	-	-	1	-	9
02	මධ්‍යම	මහනුවර	34	-	-	2	1	-	3	-	28
		මාතලේ	6	-	-	-	-	1	-	-	5
		නුවරඑළිය	4	-	-	-	-	-	-	-	4
03	දකුණ	ගාල්ල	13	1	-	1	-	-	-	1	10
		මාතර	10	-	-	-	-	-	2	-	8
		හම්බන්තොට	11	-	-	-	-	-		-	11
04	ඌව	මොණරාගල	12	-	-	-	-	-	1	-	11
		බදුල්ල	17	-	1	1	-	-	-	-	15
05	සබරගමුව	රත්නපුර	15	1	-		-	-	-	-	14
		කෑගල්ල	20	-	-	1	2	-	-	-	17
06	නැගෙනහිර	අම්පාර	7	-	-	1	1	-	-	-	5
		ත්‍රිකුණාමලය	0	-	-	-	-	-	-	-	-
		මඩකළපුව	0	-	-	-	-	-	-	-	-
07	වයඹ	පුත්තලම	7	-	-	-	-	-	-	-	7
		කුරුණෑගල	26	-	-	2	1	1	-	-	22
08	උතුරු මැද	අනුරාධපුර	15	2	1	4	1	-	1	-	6
		පොළොන්නරුව	10	-	-	5	-	-	-	-	5
එකතුව			**262**	**4**	**2**	**20**	**6**	**3**	**9**	**1**	**217**



විරු සහන ණය වැඩසටහන යටතේ සමස්ත ප්‍රතිලාභීන් 262 යුද, නාවික හා පොලිස් යන සේවාවන් අනුව බෙදී ගොස් ඇති ආකාරය පහත සටහන මගින් දැක්වේ.

යුධ	247
නාවික	09
පොලිස්	06
එකතුව	262











නිවාස ණය ව්‍යාපෘතිය යටතේ අලුත්වැඩියා කරමින් පවතින හා වැඩ නිම කර ඇති නිවාසවල ඡායාරූප

4.4. "රණවිරු දිරිය" ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය

අප දේශයේත්, ජනතාවගේත් ආරක්ෂාව වෙනුවෙන් දිවිපිදූ, අතුරුදහන්, ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ පවුල් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සම්පාදනය කරමින්, කුසලතා හා දක්ෂතා වැඩිදියුණු කර ගැනීම සඳහා විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබා දෙමින් හැකියාවන් වර්ධනය කර ඔවුන් ව්‍යවසායකයින් බවට පත් කිරීම "රණවිරු දිරිය" ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

ජනතා කේන්ද්‍රීය ආර්ථික පිළිවෙතක් වෙත නැඹුරු වීමෙන් රටේ සම්පත් රට තුළ ම ඉතිරි කරමින් දේශීය ව්‍යවසායකයා ශක්තිමත් කරන ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ආබාධිත රණවිරුවන් හා ක්‍රියාන්විතයේ දී මියගිය, අතුරුදන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් තුළ ආකල්පමය වෙනසක් ඇතිකර එමගින් කුසලතාවයෙන් යුතු ව්‍යවසායකයන් පිරිසක් බවට පත් කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ය.

රණවිරු පවුල්වල සාමාජිකයින්ගේ සහජ දක්ෂතා පදනම්ව පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ස්වයං රැකියා සඳහා දිරිමත් කිරීම මෙන් ම කෘෂි ආනයනික බෝග වගාව හා කිරි ගොවිතැන හඳුන්වා දෙමින් රණවිරු පවුල්වල සාමාජිකයින්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම හා ඉතිරි කිරීම වර්ධනය කිරීම තුළින් රටේ ආර්ථිකයට සක්‍රීයව දායකත්වය ලබා දීමට හැකි වේ.

දිවිපිදූ, අතුරුදහන් රණවිරු පවුල් සඳහා සහ ආබාධිත විශ්‍රාමික රණවිරුවන් සඳහා ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හා වැඩි දියුණු කරගැනීම වෙනුවෙන් ණය පහසුකම් ලබා දීම මේ යටතේ සිදු කෙරේ. එහි දී ණය ප්‍රතිලාභියෙකුට හිමිවන ණය මුදල රු.1,000,000.00 ක් වන අතර 5%ක සේවා ගාස්තුවක් මේ සඳහා අය කරනු ලැබේ.

4.4.1. "රණවිරු දිරිය" ණය ලබා දීමේ ප්‍රගතිය පළාත් අනුව

අනු අංකය	පළාත	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	බස්නාහිර	13
02	දකුණ	9
03	උතුරුමැද	11
04	මධ්‍යම	11
05	වයඹ	6
06	නැගෙනහිර	5
07	ඌව	5
08	සබරගමුව	7
එකතුව		67



4.4.2. රණවිරු දිරිය ණය ලබාදීමේ ප්‍රගතිය දිස්ත්‍රික්ක අනුව

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	කලුතර	2
02	කොළඹ	5
03	ගම්පහ	6
04	ගාල්ල	4
05	මාතර	3
06	හම්බන්තොට	2
07	අනුරාධපුරය	6
08	පොළොන්නරුව	5
09	මහනුවර	8
10	මාතලේ	2
11	නුවරඑළිය	1
12	පුත්තලම	1
13	කුරුණෑගල	5
14	අම්පාර	5
15	බදුල්ල	2
16	මොණරාගල	3
17	රත්නපුර	5
18	කෑගල්ල	2
එකතුව		67



4.4.3. ක්ෂේත්‍ර අනුව ස්වයං රැකියා ණය ලබාදීමේ ප්‍රගතිය

අනු අංකය	කර්මාන්තය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	ඇදුම් මැසීම	5
02	රූපලාවන්‍ය කටයුතු	4
03	වෙළඳ ව්‍යාපාර සහ සිල්ලර වෙළඳාම	20
04	බිම්මල් වගාව	5
05	කුළුබඩු වර්ග පැකට් කිරීම හා අලෙවිය	3
06	හාඩ්වෙයාර්	4
07	කජු ආශ්‍රිත නිෂ්පාදන	1
08	තේ වගාව	1
09	බුලත් වගාව	1
10	පොල්තොල් සිඳීම	1
11	ඇඹරුම් හල්	2
12	ආපන ශාලා	6
13	ඇඟලුම් කර්මාන්ත ශාලා	1
14	ගඩොල් කැපීම	4
15	රසකැවිලි නිෂ්පාදනය	2
16	පශු සම්පත් පාලනය	1
17	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන	1
18	බේකරි ආශ්‍රිත නිෂ්පාදන	3
19	අයිස් ක්‍රීම් නිෂ්පාදන	2



4.4.4. රණවිරු දිරිය ණය ව්‍යාපෘතිය මගින් දිරි ගැන්වූ රණවිරු පරපුර

4.4.4.1.කිතුල් ආශ්‍රිත නව නිෂ්පාදන අලෙවිසැල හා හෙළ බොජුන් හල

මාතලේ දිස්ත්‍රික්කයේ,රත්තොට රණවිරු සංසදය නියෝජනය කරනු ලබන ක්‍රියාන්විතයේදී ආබාධිත තත්ත්වයට පත් වූ ක්‍රෝප්‍රල් විජය කුමාරසිංහ රණවිරුවාගේ කිතුල් ආශ්‍රිත නව නිෂ්පාදන අලෙවිසැල හා හෙළ බොජුන් හල විවෘත කිරීමේ සමාරම්භක උත්සවය රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂක විශ්‍රාමික මේජර් ජෙනරල් කිත්සිරි ඒකනායකගේ ප්‍රධානත්වයෙන් 2021 නොවැම්බර් මස 01 වන දින සිදු විය.

සෙ/301757 කෝප්‍රල් කුමාරසිංහ W.G.W, 3 වන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට අනුයුක්තව යාපනය තෙලෙප්පලයි ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද චණ්ඩමාරුත ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටියදී 1992.05.29 වන දින පීඩන බෝම්බයකට ලක්ව තුවාල සිදුව වම් පාදයේ දණහිසට පහළින් ඉවත් කර ඇති රණවිරුවෙකි.

මෙම ව්‍යාපෘතිය රණවිරු සේවා අධිකාරියේ ස්වයං රැකියා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනකි. මූලිකව කිතුල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරමින් අනතුරුව ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය මගින් පිරිවැය සපුරා ගෙන ක්‍රමිකව දියුණු කර ගත් මෙම ව්‍යාපාරය රණවිරු ප්‍රජාව ආර්ථික සවිබලකරණයෙහිලා රණවිරු දිරිය ණය වැඩසටහනෙහි සාර්ථකත්වය පිළිඹිබු කරයි.





කිතුල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිසැල හා නිෂ්පාදන

4.4.4.2. මහ පොළොවට ජීවය දුන් දිරි විරු ගොවි රජු

මාතෘභූමියේ උත්තරීතර නිදහස වෙනුවෙන් සටන් වැදී සරසාලේ ප්‍රදේශයේ දී පුද්ගල නාශක බෝම්බයකට හසුවීමෙන් සිය පාදය අහිමි වූ පසුව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද 4 වන ගැමුණු හේවා රෙජිමේන්තුවේ සේවය කළ උපාලි වීරසිංහ රණවිරුවා මිහිකතට ජීවය දුන් අභිමානවත් රණවිරුවෙකි.

රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රදේශයේ පදිංචි ඔහු තම විශ්‍රාම දිවිය අර්ථවත් ලෙස ගත කරන රණවිරුවෙකු වේ. කුඩා කල පටන්ම හුරු වී සිටි ගෙවතු වගාව මගින් ඔහු වර්තමානය වන විට අති සාර්ථක ගොවිපළක හිමිකරුවෙකු බවට පත් කර තිබේ. තම ගෙවතු වගාව ක්‍රමයෙන් අක්කර ගණනාවක භූමි භාගයක් පුරා ව්‍යාප්ත කරමින් මේ වන විට දක්ෂ ව්‍යවසායකයෙක් බවට පත් වී ඇති උපාලි වීරසිංහ රණවිරුවා 2020 වසරේ රත්නපුර දිස්ත්‍රික් හොඳම ව්‍යවසායකයා තේරීමේ තරඟයෙන් ප්‍රථම ස්ථානය හිමිකර ගනිමින් රන් සම්මානය දිනා ඇත.

ස්වකීය ගොවිපළ සාර්ථක ආදායම් උත්පාදක ක්ෂේත්‍රයක් බවට පත් කරමින් ගොවිපළ තුළ නව රැකියා අවස්ථා කිහිපයක් ලබා දීමට ද ඔහුට හැකියාව ලැබී ඇත. ඉදිරි වසර කිහිපය තුළ තම වගාව අක්කර 100ක භූමි ප්‍රදේශයක් පුරා ව්‍යාප්ත කිරීමට ඔහු අපේක්ෂා කරයි.





.

4.4.4.3. සුරතල් මත්ස්‍ය ව්‍යාපාරයෙන් දැත් සවිමත් කරගත් රණවිරුවෙක්

මව්බිමේ නිවහල් බව වෙනුවෙන් ශරීරාංග පුදකළ රණවිරුවන් දැයේ සංවර්ධනයට දායක කරගැනීමේ අභිලාෂය යටතේ රණවිරු සේවා අධිකාරියේ අනුග්‍රහයෙන් ඇහැලියගොඩ රණවිරු සංසදයේ ඩබ්.එම්.ඒ.පී.කේ. විජේසුන්දර මහතා ස්වයං රැකියාවක් ලෙස “Pearl Fish Paradise” නමින් විසිතුරු මත්ස්‍ය අපනයන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි.

රණවිරු සේවා අධිකාරිය මගින් ලබා දුන් ස්වයං රැකියා ආධාර මුදලින් හා ස්වකීය උත්සහය, කැපවීම හා ධෛර්යය මත මාළු ටැංකි 60 කින් සමන්විතව මෙම සුරතල් මත්ස්‍ය ව්‍යාපාරය සාර්ථකව පවත්වාගෙන යනු ලබයි. විසිතුරු මසුන් අපනයනය කරමින් මව්බිමට විදේශ විනිමය උපයා දීමට මෙම දිරිය රණවිරුවා සිය දායකත්වය ලබා දෙයි.





විසිතුරු මත්ස්‍ය ව්‍යාපාරය පිළිබඳ නිරීක්ෂණ සිදු කරමින්





ව්‍යාපාර කටයුතුවල නියැලෙන රණවිරු ව්‍යවසායකයින්

4.5. රණවිරු මාපිය සුරැකුම වැඩසටහන

ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය හා අතුරුදහන් විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන් වෙත 2007 වසරේ නොවැම්බර් මස 21 වන දින සිට රණවිරුවාගේ වැටුපෙන් 25% ක මුදලක් ගෙවීම සිදු කරනු ලබයි. එහෙත් ඉහත කාල සීමාවට පෙර මියගිය විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන්ට කිසිදු දීමනාවක් නොලැබෙන අතර, එම දෙමව්පියන්ට කෘතගුණ සැලකීමක් වශයෙන් රජයේ විශ්‍රාමික වැටුප් නොලබන රණවිරු දෙමව්පියන් වෙත රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන යටතේ මූල්‍යාධාර පිරිනමනු ලබයි.

මෙම ප්‍රතිලාභයට දායක වන සෑම දෙමාපියෙකුටම රණවිරු සේවා අධිකාරිය මගින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැපැල් බැංකු ශාඛා ගිණුම් ආරම්භ කරනු ලබන අතර, දෙමව්පියන් දෙදෙනාගෙන් එක් අයෙකු පමණක් සිටී නම් මාසිකව රු. 2,250.00 බැගින් ද, දෙමව්පියන් දෙදෙනාම සිටී නම් එක් අයෙකු සඳහා මාසිකව රු. 1,500.00 බැගින් රු. 3,000.00 ක මුදලක් ලබා දීම සිදු කරන අතර මුදල් ලබා ගැනීම ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා තැපැල් කාර්යාල මගින් සිදු කර ගැනීමට හැකිය.

සෑම මසකම අවසානයේ ගිණුම්වලට මුදල් බැර කරන අතර ගිණුමේ මුදල ඉතිරි නොකර අදාළ මස මුදල ලබා ගන්නා ලෙස ප්‍රතිලාභීන් දැනුවත් කර ඇත. ගිණුම් හිමියා මිය ගිය විට මරණ සහතිකය හා ගිණුම් පොත ඉදිරිපත් කළ පසු ගිණුමේ මුදල් රණවිරු සේවා අධිකාරියේ ගිණුමට බැර වේ. ගිණුමෙන් මුදල් ලබා ගත හැකි වන්නේ අදාළ ප්‍රතිලාභියාට පමණක් වන අතර දෙමාපියන් දෙදෙනාම ජීවත්ව සිටින විට එක් අයෙකු මිය ගිය බව දැනුම් දුන් පසු ජීවත්ව සිටින ප්‍රතිලාභියාට මාසිකව ගෙවන මුදල රු.2250 ක් දක්වා වැඩි කරනු ලබයි.

4.6. ඉඩම් අංශය

රණවිරු පවුල් සාමාජිකයන් වෙත සුභසාධන කටයුතු ඉටු කිරීමේදී හා ඔවුන් විසින් ලැබෙන ඉල්ලීම් සලකා බැලීමේදී ස්ථිර වාසස්ථාන සපයා ගැනීමේ යම් දුෂ්කරතාවන්ට මුහුණදෙන බව හඳුනාගත හැකිය. නිවාස ඉදි කර ගැනීමට ණය හා ආධාර ලබා දීමට විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වුව ද නිවාස ඉදි කර ගැනීම සඳහා ඉඩම් නොමැති වීම මත මෙම ගැටලුව උද්ගත වේ. බොහෝ දෙනෙකු හවුල් ඉඩම්වල තාවකාලික වාසස්ථාන ඉදි කරගෙන සිටීම, අනවසර ඉඩම්වල පදිංචි වී සිටීම, බලපත්‍ර හෝ ඔප්පු රහිතව ඉඩම් අත්පත් කරගෙන සිටීම වැනි කරුණු මත රණවිරු ප්‍රජාව වෙත නිවාස සැපයීමේ දී ඉඩම් පිළිබඳව ගැටලුකාරී තත්ත්වයන් මතුව ඇත.

එයට විසඳුමක් වශයෙන් රණවිරු සේවා අධිකාරියේ ඉඩම් ව්‍යාපෘතිය මගින් රණවිරුවන් වෙත ඉඩම් හිමි කර දී ස්ථිර වාසස්ථානයක අවශ්‍යතාවය සපුරාලීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මහවැලි සංවර්ධන අධිකාරිය, ඉඩම් කොමසාරිස් කාර්යාලය හා නිවාස සංවර්ධන අධිකාරිය වැනි ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් ඉඩම් ගැටලු හා සම්බන්ධ ලිපි යොමු කරමින් ඉඩම් සම්බන්ධ විසඳුම් ලබා දීම ආදී දෑ ඉඩම් අංශය මගින් සිදු වේ.

4.6.1. ඉඩම් කොටස් ලබා දීම

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ඉඩම් ප්‍රමාණය	අදාළ ආයතනය
01	රස්නායකපුර	05	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
02	කිලිනොච්චිය	01	
එකතුව		06	

4.6.2. ඉඩම් කොටස් ලබාදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ඉඩම් ප්‍රමාණය	අදාළ ආයතනය
01	හෝමාගම	2	ප්‍රාදේශීය ලේකම් කාර්යාල
02	වරකාපොල	1	
03	කතරගම	1	
04	මුතූර්	1	
05	මිහින්තලේ	1	
06	අම්බලන්තොට	1	
07	කොලොන්න	1	
08	ගෝනාපිනුවල	1	
09	අනුරාධපුර	1	
12	දිගන	1	මහවැලි අධිකාරිය
13	බිසෝපුර	1	
14	වැලිකන්ද	1	
15	මැදිරිගිරිය	1	
10	හික්කඩුව	1	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව
11	මතුගම	1	
එකතුව		16	

4.6.3. රජයේ ඉඩම් සඳහා ඔප්පු/බලපත්‍ර ලබාදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

කාර්යය	ප්‍රමාණය	සටහන්/අදාළ ආයතන
රණවිරුවන්ගේ ඉල්ලීම්වලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් යොමු කර ඇති ලිපි වලට අදාලව අනවසරයෙන් පදිංචි වී ඇති ඉඩම් සඳහා ඔප්පු/බලපත්‍ර ලබා ගැනීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම. (ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2005.03.03 වන දින 4/10/චක්‍රලේඛය,2005/03 දරණ චක්‍රලේඛය සහ 2016/07 චක්‍රලේඛයට අනුව)	95	ඉඩම් කොමසාරිස් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහවැලි අධිකාරිය,ඉඩම් ප්‍රතිසංස්කරණ කාර්යාලය

4.6.4. වෙනත් ආයතන සඳහා ලිපි යොමු කිරීම / අඩුපාඩු ගෙන්වා ගැනීම

අනු අංකය	කාර්යය	ප්‍රමාණය
01	ක්‍රියාන්විත නොවන හේතූන් මත ආබාධිත/දිවිපිදූ රණවිරුවන් සහ දැනට සේවයේ නියුතු/ විශ්‍රාමික රණවිරුවන්ගේ ගැටළු අදාල ආයතන වෙත යොමු කිරීම	05
02	වෙනත් ආයතන වෙත ලිපි යොමු කිරීම	06
03	අඩුපාඩු සහිත ලිපි සඳහා නොරතුරු ගෙන්වා ගැනීම	07
04	අයදුම්පත් යොමු කිරීම ඉඩම් ඉල්ලීම් අයදුම්පත් ඔප්පු/බලපත්‍ර අයදුම්පත්	12 04
05	ඉඩම් අයදුම්පත් ලැබීම	15
06	ඉඩම් ගැටළු සඳහා ලිපි යොමු කිරීම	04
07	දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරීන් වෙත ලිපි යොමු කිරීම	02

4.6.5. අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති ඉඩම්

අනු අංකය	ඉඩමේ නම	රණවිරුවන් වෙත ලබා දී ඇති ඉඩම් කොටස් ගණන	වර්තමාන තත්ත්වය
01	බලංගොඩ ඉඩම	09	ඔප්පු සකස් කර ඇත.
02	මීරිගම ඉඩම	01	ඔප්පු සකස් කිරීමේ අදාල කටයුතු සඳහා නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත.
03	කෑගල්ල ඉඩම	02	
04	වතුමුල්ල ඉඩම	01	තාවකාලික බලපත්‍රයක් මගින් ලබා දී ඇ

4.6.6. රණවිරු සේවා අධිකාරිය මගින් සිදු කරන ලද ඉඩම් සඳහා ඔප්පු ලබා දීම

ඉඩම් නොමැති රණවිරුවන් වෙත ලබාදීම සඳහා ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචි පරිත්‍යාගශීලියකු වන එල්. කේ. කුසුමාවතී මහත්මිය විසින් තම මියගිය ස්වාමිපුරුෂයාට පිං පිණිස තෑගි ඔප්පුවකින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද රෑඩ් දෙකයි පර්චස් 38 ක ඉඩමෙන් පර්චස් 10 බැගින් වූ ඉඩම් කැබලි නමයක් ආබාධිත රණවිරුවන් 8 දෙනෙකුට සහ මියගිය රණවිරුවෙකුගේ මවකට ලබා දීම සඳහා ඔප්පු අත්සන් කිරීමේ මූලික වැඩසටහනක් රණවිරු සේවා අධිකාරියේ දී 2021 නොවැම්බර් මස 12 වන දින පවත්වන ලදී.

මෙහිදී සබරගමු පළාතට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ, බලන්ගොඩ ප්‍රදේශයේ, මැදකොරලේ හෙල උඩපත්තුවේ, අංක 254, පහළ මස්සැන්න බලංගොඩ ග්‍රාම සේවා වසම තුළ පිහිටි අබේසිංහ හේන හෙවත් විලේගොඩ කෑල්ල ඉඩම (රෑඩ් දෙකයි පර්චස් 38 ක) තාවකාලික බලපත්‍ර මගින් පදිංචිය සඳහා රණවිරු පවුල් නමයක් සඳහා ලබාදී තිබුණි. මෙම ඉඩම් කැබලි සඳහා වන නිත්‍යානුකූල අයිතිය පැවරීම සඳහා රණවිරු සේවා අධිකාරියේ මැදිහත්වීම මත ශ්‍රී ලංකා යුද හමුදාවේ නීති සේවා අධ්‍යක්ෂක මණ්ඩලයේ සහාය ඇතිව රණවිරු පවුල් 09 සඳහා සින්නක්කර ඔප්පු අත්සන් කිරීම සිදු විය.









05

වෛද්‍ය ආධාර හා ණය ලබාදීම

5.1. වෛද්‍ය ආධාර ලබාදීම

ක්‍රියාන්විත හේතූන් මත රණක්ෂිතයට පත් වූ ආබාධිත විශ්‍රාමික රණවිරුවන්, ත්‍රිවිධ හමුදාව හෝ පොලිස් සේවයේ දිවි පිදූ විවාහක රණවිරුවන්ගේ සම්පූර්ණ වැටුප නොලබන දෙමාපියන්, ත්‍රිවිධ හමුදාව හෝ පොලිස් සේවය මගින් විශ්‍රාම වැටුප/යැපෙන්නන්ගේ දීමනාව පමණක් ලබන දිවි පිදූ රණවිරුවන්ගේ භාර්යාවන් සහ වයස අවුරුදු 26 ට අඩු අවිවාහක, රැකියා විරහිත දූ දරුවන් සඳහා වෛද්‍ය ආධාර පිරිනමනු ලබයි.

රණවිරු ප්‍රජාව වෙතින් ලැබෙන ඉල්ලීම් අනුව හදිසි සැත්කම් සඳහා ආධාර කිරීම, වෛද්‍ය පරීක්ෂණ සඳහා සහාය වීම, රෝග තත්ත්වයන් මගහරවා ගැනීමට අත්‍යවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබා දීම, ආර්ථික අපහසුතා ඇති රෝගයන්ගෙන් පෙළෙන රණක්ෂිතයටපත් රණවිරුවන් සහ රණවිරු ඥාතීන් වෙත ප්‍රතිකාර ගැනීම සඳහා සහාය වීම මෙම වැඩසටහන යටතේ සිදු කරයි.

ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබාගත හැකි රෝහලක් වෙතින් අවශ්‍ය ප්‍රතිකාර, පරීක්ෂණ හෝ සැත්කම් සිදුකර ගැනීමට ප්‍රමාණවත් මූල්‍ය සහයෝගයක් ලබාදීම අත්‍යාවශ්‍ය වේ. රෝගයට ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ඇති ආයතනයන් වෙත යොමු වී කඩිනමින් සේවා ලබාගැනීමට මූල්‍යමය දායකත්වය ලබාදීම මෙම වැඩසටහන මගින් සිදු වෙයි. රණවිරුවා සඳහා උපරිමය රු.500,000.00ක් ද, රණවිරු ඥාතීන් සඳහා උපරිමය රු.75,000.00ක් ද වශයෙන් මූල්‍ය ආධාර ලබා දීම මේ යටතේ සිදු වේ.

5.2. වෛද්‍ය ණය ලබාදීම

රණවිරු ප්‍රජාව මුහුණ දෙන විවිධ සෞඛ්‍ය ගැටලු පදනම් කරගෙන වාර්ෂිකව විශාල පිරිසක් වෛද්‍ය ආධාර අයදුම් කරයි. හදිසි සැත්කම් හා ප්‍රතිකාරයන් සඳහා බහුතරයක් ඉල්ලීම් යොමු කරන අතර මින් වැඩි පිරිසක් වැටුප් හා දීමනා ලබන පුද්ගලයන් වේ. වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන් වූ රණවිරුවන් අදාළ ආබාධිත තත්ත්වයන්ට හේතු වූ කරුණුවල සෘජු හෝ වක්‍ර බලපෑම් මත තවදුරටත් රෝගයන්ට ගොදුරුවීම සිදු වේ. රණවිරුවන් හා රණවිරු ඥාතීන් ද වැරදි පෝෂණ පුරුදු නිසා බෝ නොවන රෝගයන්ට ගොදුරු වීමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගන්නා අතරම හදිසි අනතුරුවලට මුහුණදීම නිසා ද සෞඛ්‍ය ගැටලු ඇතිවීම නොවැළැක්විය හැකිය. එසේම වයෝවෘද්ධ තත්ත්වය මත විවිධ රෝගයන්ට ගොදුරුවීම නිසා සෞඛ්‍ය පිරිහීමට ලක් වේ.

මෙවැනි සාධක නිසා රණවිරු ප්‍රජාව ගොදුරුවන රෝගාබාධයන් සඳහා ක්ෂණික ප්‍රතිකාර ලබාගැනීමට රජයේ රෝහල්වල රෝගීන් දීර්ඝ කාලීනව පොරොත්තු ලේඛනගත කිරීම වැනි කරුණු හේතුවෙන් රෝග තත්ත්වයන් උත්සන්න වීම හා වෙනත් අතුරු ආබාධයන්ට ලක්වීම සිදුවිය හැකි අතර ඒ හේතු කොටගෙන අකල් මරණයන්ට ද ගොදුරුවිය හැකිය.

එසේම රජයේ රෝහල්වල ප්‍රතිකාර කිරීමේ ක්‍රියා පටිපාටියෙන් බැහැරව පුද්ගලික අංශයෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා මූල්‍ය වැයක් දැරීම අවශ්‍යවන අතර එලෙස පුද්ගලික අංශයේ රෝහල් වෙතින්

ප්‍රතිකාරයන් ලබාගැනීමට ආර්ථික ශක්තියක් නොමැතිකම නිසා රෝගයට නිසි ප්‍රතිකාර කලට වෙලාවට නොලැබීමෙන් රෝගී තත්ත්වය උත්සන්න විය හැකිය.

එවන් අවස්ථාවල දී වෛද්‍ය නිර්දේශය මත හදිසි මූල්‍යාධාර අවශ්‍ය රණවිරු ප්‍රජාව වෙනුවෙන් පොලී රහිත ණය මුදලක් ලබා දීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වේ. රෝගයට ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ඇති ආයතනයන් වෙත යොමුවී කඩිනමින් සේවා ලබාගැනීමට මූල්‍යමය දායකත්වය ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුකරනු ලැබේ.

රු.500,000.00 ක මුදලක් උපරිමය වශයෙන් වෛද්‍ය ණය මුදලක් ලෙස ලබාගත හැකිය. ණය මුදල අයකරන කාලය උපරිමය වාරික 36 කි. මෙම ණය මුදල ලබාදීමේ දී කිසිදු සේවා ගාස්තුවක් අය නොකරයි.

5.3. වෛද්‍ය ණය හා ආධාර ලබාදීමේ ක්‍රමවේදය



5.4. වෛද්‍ය ආධාර ප්‍රතිලාභ බෙදී යාම



5.5. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ආධාර ලබාදීම

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
01	අනුරාධපුර	5
02	අම්පාර	1
03	කලුතර	4
04	කුරුණෑගල	2
05	කොළඹ	4
06	ගම්පහ	4
07	ගාල්ල	1
08	පොළොන්නරුව	4
09	බදුල්ල	3
10	මහනුවර	2
11	මාතර	1
12	මාතලේ	3
13	රත්නපුර	4
14	හම්බන්තොට	2
එකතුව		40



5.6. වෛද්‍ය ණය ප්‍රතිලාභ බෙදී යාම

2021 වසරේ දී රණවිරු ඥතීන් සිව් දෙනකු වෙත හදිසි වෛද්‍ය ප්‍රතිකාර හා ශල්‍යකර්ම සඳහා වැයවන මුදල් අවශ්‍යතාවය සඳහා මිලියන 02ක මුදලක් වෛද්‍ය ණය මුදල් වශයෙන් ලබා දී ඇත.



රණවිරු පියෙකු
සඳහා ලක්ෂ 05



රණවිරු බිරින්ඳෑවරුන්
දෙදනකු සඳහා රු. ලක්ෂ
5 බැගින්



රණවිරු දරුවකු
සඳහා ලක්ෂ 05

5.7. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ණය ලබාදීම

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
01	අනුරාධපුර	1
02	ගාල්ල	1
03	රත්නපුර	2
එකතුව		4



06

අධ්‍යාපන ශිෂ්‍යත්ව හා තරුණ කටයුතු අංශය

6.1. හැඳින්වීම

ක්‍රියාන්විතයේදී ජීවිත පූජා කරමින් කටයුතු කළ රණවිරුවන්ගේ දු දරුවන් හා ශරීරාංග පූජා කරමින් ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන්ගේ දු දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ පාසල් අධ්‍යාපනය අ.පො.ස. සාමාන්‍ය පෙළ, උසස් පෙළ දක්වා සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සාර්ථකව අවසන් කිරීම දක්වා අවශ්‍ය මූල්‍ය සහාය ලබාදෙමින්, ඔවුන් ආර්ථික වශයෙන් දිරිමත් කරමින්, සමාජයීය හා වෘත්තීමය වශයෙන් රටට දැයට වැඩදායී යහපත් දරු පරපුරක් සමාජයට දායද කිරීම හා උසස් අධ්‍යාපනය සඳහා තේරී පත් නොවූ දු දරුවන් ද සමාජය සුභසිද්ධියට අවශ්‍ය වෘත්තීය මට්ටමෙන් පරිපූර්ණ වැඩදායී පුද්ගලයන් බවට පත්කිරීම.

6.2. අංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

6.2.1. 6 – 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යාධාර වැඩසටහන

රණවිරුවන්ගේ 6 -11 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන දු දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහනේ දී 6 ශ්‍රේණිය සිට අ.පො.ස. සාමන්‍ය පෙළ අධ්‍යාපනය තෙක් මසකට රු.500/- බැගින් 6 ශ්‍රේණිය සඳහා වාරික 72 ක් ද, 7 ශ්‍රේණිය සඳහා වාරික 60 ක් ද, 8 ශ්‍රේණිය සඳහා වාරික 48 ක් ද, 9 ශ්‍රේණිය සඳහා වාරික 36 ක් ද, 10 ශ්‍රේණිය සඳහා 24 ක් ද, 11 ශ්‍රේණිය සඳහා වාරික 12 ක් ද වශයෙන් ශිෂ්‍යාධාර මුදල් ලබාදන අතර එය දු දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවල දී ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි අදාළ දු දරුවන්ගේ නමින් මව/පියා භාරකාරත්වයේ ඇති ජාතික ඉතිරිකිරීම් බැංකු ගිණුම සඳහා මාසික මුදල් ප්‍රේෂණය කිරීම මෙම වැඩසටහන මගින් සිදු කරයි.

අනු අංකය	ඉගෙනුම ලබන ශ්‍රේණිය	ගෙවනු ලබන වාරික මුදල (රු)	ගෙවනු ලබන මුලු වාරික ගණන
01	6 ශ්‍රේණිය	500/-	72
02	7 ශ්‍රේණිය	500/-	60
03	8 ශ්‍රේණිය	500/-	48
04	9 ශ්‍රේණිය	500/-	36
05	10 ශ්‍රේණිය	500/-	24
06	11 ශ්‍රේණිය	500/-	12

6.2.1.1. දිස්ත්‍රික්ක හා පළාත් අනුව 6-11 ශ්‍රේණිය දක්වා දක්වා ශිෂ්‍යත්ව බෙදීයාම

අනු අංකය	දිස්ත්‍රික්කය	6-11 ශිෂ්‍යත්ව ප්‍රමාණය	පළාත	6-11 ශිෂ්‍යත්ව ප්‍රමාණය
01	කොළඹ	27	බස්නාහිර	97
02	ගම්පහ	37		
03	කළුතර	33		
04	කුරුණෑගල	98	වයඹ	109
05	පුත්තලම	11		
06	ගාල්ල	27	දකුණ	87
07	මාතර	24		
08	හම්බන්තොට	36		
09	කෑගල්ල	49	සබරගමුව	75
10	රත්නපුර	26		
11	බදුල්ල	52	ඌව	91
12	මොණරාගල	39		
13	අනුරාධපුර	105	උතුරු මැද	141
14	පොළොන්නරුව	36		
15	මහනුවර	53	මධ්‍යම	107
16	මාතලේ	25		
17	නුවරඑළිය	29		
18	අම්පාර	30	නැගෙනහිර	35
19	ත්‍රිකුණාමලය	5		
එකතුව				742



6.2.2.අ.පො.ස. උසස් පෙළ ශිෂ්‍යාධාර වැඩසටහන

රණවිරුවන්ගේ අ.පො.ස. උසස් පෙළ අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහනේ දී මසකට රු.1500/- බැගින් උපරිම වාරික 24ක් ඇතුළත් වන සේ ඔවුන්ගේ උසස් පෙළ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි දරුවන්ගේ නමින් ඇති ගිණුම් වෙත මාසික මුදල් බැර කිරීම මෙම වැඩසටහන මගින් සිදු කරයි.

අනු අංකය	දිස්ත්‍රික්කය	උ/පෙළ ශිෂ්‍යත්ව ප්‍රමාණය	පළාත	උ/පෙළ ශිෂ්‍යත්ව ප්‍රමාණය
01	කොළඹ	14	බස්නාහිර	62
02	ගම්පහ	32		
03	කළුතර	16		
04	කුරුණෑගල	57	වයඹ	64
05	පුත්තලම	7		
06	ගාල්ල	18	දකුණ	43
07	මාතර	11		
08	හම්බන්තොට	14		
09	කෑගල්ල	30	සබරගමුව	45
10	රත්නපුර	15		
11	බදුල්ල	20	ඌව	37
12	මොණරාගල	17		
13	අනුරාධපුර	40	උතුරු මැද	57
14	පොළොන්නරුව	17		
15	මහනුවර	27	මධ්‍යම	48
16	මාතලේ	12		
17	නුවරඑළිය	9		
18	අම්පාර	23	නැගෙනහිර	27
19	ත්‍රිකුණාමලය	4		
එකතුව		383		



6.2.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර වැඩසටහන

රණවිරුවන්ගේ විශ්වවිද්‍යාල, විද්‍යාපීඨ හා රජයේ අනුමත වෙනත් උසස් අධ්‍යාපන පාඨමාලා සඳහා තේරී පත් වූ දරුවන් සඳහා මසකට රු.3000/- බැගින් ඔවුන්ගේ අධ්‍යයන වසරවල් තුළ උපරිම වාරික 48ක් ඇතුළත් වන සේ ශිෂ්‍යාධාර ලබාදේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රමාණය	පළාත	උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රමාණය
01	කොළඹ	5	බස්නාහිර	31
02	ගම්පහ	16		
03	කළුතර	10		
04	කුරුණෑගල	14	වයඹ	16
05	පුත්තලම	2		
06	ගාල්ල	9	දකුණ	18
07	මාතර	5		
08	හම්බන්තොට	4		
09	කෑගල්ල	10	සබරගමුව	15
10	රත්නපුර	5		
11	බදුල්ල	13	ඌව	19
12	මොණරාගල	6		
13	අනුරාධපුර	10	උතුරු මැද	15
14	පොළොන්නරුව	5		
15	මහනුවර	13	මධ්‍යම	17
16	මාතලේ	1		
17	නුවරඑළිය	3		
18	අම්පාර	3	නැගෙනහිර	7
19	ත්‍රිකුණාමලය	4		
එකතුව		135		



6.2.4. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පාඨමාලා ආධාර වැඩසටහන

අ.පොෙ.ස සා/පෙළ, උ/පෙළ සමත් අසමත් සෑම දෙනාටම උසස් වෘත්තීය අධ්‍යාපනය ලබාදීම සඳහා රණවිරු දරුවන් උසස් අධ්‍යාපන පාඨමාලාවලට යොමු කිරීමේ අරමුණින් වෘත්තීය පාඨමාලා හදාරන දරුවන් සඳහා පාඨමාලා ගාස්තුව ඇතුළත් වන සේ උපරිම රු.50,000/-ක පාඨමාලා ආධාර ලබාදීම මෙම වැඩසටහන මගින් සිදු කරයි.

අනු අංකය	දිස්ත්‍රික්කය	පාඨමාලා ආධාර ප්‍රමාණය	පළාත	පාඨමාලා ආධාර ප්‍රමාණය
01	ගම්පහ	1	බස්නාහිර	2
02	කළුතර	1		
03	කුරුණෑගල	1	වයඹ	2
04	පුත්තලම	1		
05	ගාල්ල	1	දකුණ	2
06	මාතර	1		
07	කෑගල්ල	1	සබරගමු	1
08	අනුරාධපුර	1	උතුරු මැද	3
09	පොළොන්නරුව	2		
10	නුවරඑළිය	1	මධ්‍යම	1
11	ත්‍රිකුණාමලය	1	නැගෙනහිර	1
එකතුව		12		

6.2.5. කුසලතා ප්‍රවර්ධන ණය ලබාදීම

අ.පොෙ.ස සා/පෙළ හා උ/පෙළ මට්ටමින් හා උසස් අධ්‍යාපන කටයුතුවලින් අධ්‍යාපනය අවසන් කරන ලද රණවිරු දරුවන් සඳහා විවිධ පාඨමාලා ඔස්සේ තම අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යමින් තම අනාගතය අධ්‍යාපනික මාර්ගයක් ඔස්සේ සැලසුම් කරගැනීමට දිරිදෙමින් ඔවුනට අවශ්‍ය

පාඨමාලාව හැදෑරීම සඳහා මූල්‍යමය වශයෙන් සහනයක් වීම අරමුණු කරගනිමින් පාඨමාලා ගාස්තුවට අදාළව අධ්‍යාපන ණය ලබාදීම මෙම වැඩසටහන මගින් සිදු කරයි.

අනු අංකය	දිස්ත්‍රික්කය	අධ්‍යාපන ණය ප්‍රමාණය	පළාත	අපොස ණය ප්‍රමාණය
01	කොළඹ	1	බස්නාහිර	4
02	ගම්පහ	1		
03	කළුතර	2		
04	කුරුණෑගල	1	වයඹ	1
05	ගාල්ල	1	දකුණ	1
06	කෑගල්ල	1	සබරගමුව	1
07	අනුරාධපුර	2	උතුරු මැද	2

6.2.6. 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම (ආරක්ෂක අමාත්‍යාංශය සමග සම්බන්ධව)

ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලබාදෙන ශිෂ්‍යාධාර වැඩසටහන සඳහා අවශ්‍ය අයදුම්පත් යොමුකිරීම මේ යටතේ සිදුකෙරේ.

6.3. රණවිරු දු දරුවන් සඳහා පරිත්‍යාගශීලි මූල්‍යාධාර ලබාදීම

උසස් අධ්‍යාපනය සඳහා තේරී පත් වූ වෛද්‍ය විද්‍යාව හදාරනු ලබන වෛද්‍ය ශිෂ්‍යයන් හතර දෙනෙකු සඳහා පරිත්‍යාගශීලින්ගේ ආධාර මුදල් ලබාදෙන දෙන ලදී.

ඒ අනුව 2021.01.01 සිට 2021.12.31 දක්වා මසකට රු.5000/- බැගින් වාරික 12 ක් වෛද්‍ය ශිෂ්‍යයන් 02 ක් සඳහාත් මසකට රු.1000/- බැගින් වාරික 12 ක් වෛද්‍ය ශිෂ්‍යයන් 02 ක් සඳහාත් ලබා දෙන ලදී.





ශිෂ්‍යාධාර ලබා දීමේ විශේෂ අවස්ථා

07

මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

7.1. හැදින්වීම හා අරමුණ

ත්‍රිවිධ හමුදාවේ සහ පොලිස් සේවයේ නියුතුව ක්‍රියාන්විත සේවයේ යෙදී සිටිය දී ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය හා ක්‍රියාන්විත නොවන හේතූන් ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ අධ්‍යාපන කටයුතු හදාරන දරුවන්, සියලුම රණවිරුවන්ගේ විශේෂ අධ්‍යාපනය හදාරන වයසේ පසුවන දරුවන් සහ දීර්ඝ කාලීනව ප්‍රතිකාර ලබාගත යුතු රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන රණවිරුවන්ගේ දරුවන් වෙත දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන්ගේ මූල්‍යමය පරිත්‍යාගයන් මත ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබයි.

7.2. 2021 වසර තුළ දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය

රණවිරු සේවා අධිකාරියේ මාපිය කැපකරු ශිෂ්‍යත්ව අරමුදල මගින් සිදු කරනු ලබන දේශයේ භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීත්වය වෙනුවෙන් සටන් වැද ස්වාභාවික හේතූන් නිසා මියගිය රණවිරුවන්ගේ දුදරුවන් 208 දෙනෙකු වෙනුවෙන් රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරාල් (විශ්‍රාමික) නන්දන සේනාධීර මහතාගේ ඉල්ලීමකට අනුව හිටපු යුද්ධ හමුදාධිපති මෙන්ම වරාය අධිකාරියේ හිටපු සභාපතිතුමන් වන ජෙනරාල් (විශ්‍රාමික) දයා රත්නායක මහතාගේ මැදිහත්වීම මත රුපියල් 1,662,000.00 ක මූල්‍ය පරිත්‍යාගයක් 2020.12.11 දින රණවිරු සේවා අධිකාරියේ දී පිරිනමන ලද අතර එම මුදල 2021 වර්ෂයේ ශිෂ්‍යාධාර ලබා දීම සඳහා වැය කරන ලදී.

මෙම මුදල සඳහා අනුග්‍රාහක දායකත්වය කොළඹ ජාත්‍යාන්තර බහාලුම් පර්යන්තයේ ප්‍රධාන විධායක නිලධාරී ජැක් හුවැන්ග් (Mr.Jack Huang) සහ පරිපාලන කළමණාකරු ග්‍රාන්ට් යෑං (Mr.Grant Yang), ද කලම්බෝ ලොජිස්ටික්ස් ගෘප් ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරනු ලබන මේජර් ජෙනරාල් චාගී ගාල්ලගේ (විශ්‍රාමික), Hapag – Llyod Lanka (Pvt) Ltd ආයතනයේ උපසභාපති ලලිත් විතානාරාච්චි මහතා, කොළඹ නැව් තටාක අංගනයේ ප්‍රධාන කළමනාකරු ඩී.වී. අබේසිංහ යන ආයතන හා පිරිස විසින් දරා ඇත.







එමෙන්ම ශිෂ්‍යත්ව ලබා දීම සඳහා ඩුබායි හි (PIMA –UAE) සංගමය මගින් රු.120,000.00 ක ආධාරයක් පරිත්‍යාග කරන ලද අතර එමගින් එක් ප්‍රතිලාභියෙකුහට රු.2,000.00 බැගින් දරුවන් 05 දෙනෙකු වෙත ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම ද සිදු කරන ලදී.

මෙම මූල්‍ය පරිත්‍යාගයන් ඇතුළුව තවත් ශිෂ්‍යාධාර පිරිනැමීම ලංකාවේ වෙසෙන හා එංගලන්තය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව වැනි රටවල සිටින ශ්‍රී ලාංකිකයන් හා විවිධ සංගම්වල ධන පරිත්‍යාගයන් මත සිදු වන අතර 2021 වසර තුළ පිරිනමන ලද ශිෂ්‍යාධාර සහ රටවල් පහත සටහන මගින් දැක්වේ.

අනු අංකය	පරිත්‍යාග හිමි වූ රටවල්	හිමි වූ ශිෂ්‍යත්ව සංඛ්‍යාව
01	ශ්‍රී ලංකාව	322
02	එංගලන්තය	50
03	එක්සත් අරාබි එමීර් රාජ්‍යය	12
04	ඕස්ට්‍රේලියාව	4



7.3. 2021 වසර තුළ මාපිය කැපකරු ශිෂ්‍යත්ව ප්‍රතිලාභ බෙදී යාම

අනු අංකය	පළාත	දිස්ත්‍රික්කය	ලබා දුන් ප්‍රමාණය
01	බස්නාහිර	කොළඹ	05
		කළුතර	23
		ගම්පහ	29
02	දකුණ	ගාල්ල	15
		මාතර	09
		හම්බන්තොට	15

03	මධ්‍යම	මහනුවර	34
		මාතලේ	25
		නුවරඑළිය	14
04	සබරගමුව	රත්නපුර	28
		කෑගල්ල	09
05	වයඹ	කුරුණෑගල	49
		පුත්තලම	04
06	උතුරුමැද	අනුරාධපුර	74
		පොළොන්නරුව	12
07	ඌව	බදුල්ල	16
		මොණරාගල	12
08	නැගෙනහිර	අම්පාර	15



7.4. එක් එක් මාසයන් තුළ දී ලබා දුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය හා ඒ සඳහා දරන ලද පිරිවැය

අනු අංකය	මාසය	ප්‍රතිලාභීන් ගණන	වැය කරන ලද මුදල
01	ජනවාරි	388	244,500.00
02	පෙබරවාරි	388	244,500.00
03	මාර්තු	388	251,500.00
04	අප්‍රේල්	386	245,500.00
05	මැයි	389	254,500.00
06	ජූනි	389	254,500.00
07	ජූලි	385	250,000.00
08	අගෝස්තු	385	250,000.00

09	සැප්තැම්බර්	385	250,000.00
10	ඔක්තෝම්බර්	391	276,000.00
11	නොවැම්බර්	390	252,000.00
12	දෙසැම්බර්	78	104,000.00



7.5. මා පිය කැපකරු ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද සමාජ මෙහෙවර

7.5.1. බෞද්ධයා නාලිකාව සමග එක්ව රණවිරු දූ දරුවන්ගේ වෙත ටැබ් යන්ත්‍ර ලබා දීම

රණවිරු සේවා අධිකාරියේ මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය මගින් බෞද්ධයා රූපවාහිනී නාලිකාව වෙතින් සිදුකරන ලද ඉල්ලීමකට අනුව ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය රණවිරු පවුල්වල අපොස සා.පෙළ හා උ.පෙළ හදාරන දරු දැරියන් තිදෙනෙකු විසින් කරන ලද ඉල්ලීම් අනුව ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සිදු කර ගෙන යාම සඳහා ටැබ් යන්ත්‍ර 03 ක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2021 නොවැම්බර් මස 2 වැනි දින කොළඹ 07 සම්බෝධි විහාරයේ දී පවත්වන ලදී

මෙහි දී නාවික හමුදාවේ සහ පොලිසියේ රාජකාරියේ නියුතුව සිට ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය රණවිරු පවුල්වල දරුවන් තිදෙනෙකු සඳහා ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම පරිත්‍යාගය සිදු කරන ලදී.






ටැබ් යන්ත්‍ර පිරිනැමීමේ විශේෂ අවස්ථා

7.5.2. ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ භාරකරුවන්හට ස්වයං රැකියා සඳහා ආධාර ලබා දීම

මා පිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය මගින් ශිෂ්‍යාධාර ලබා ගන්නා දරුවන් සිටින ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය රණවිරුවන්ගේ බිරින්දෑවවරුන් හා ක්‍රියාන්විත නොවන හේතූන් මත ආබාධිත වූ රණවිරුවෙකුහට ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා මූල්‍යාධාර ලබා ගැනීමට පරිත්‍යාගශීලීන් සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම මෙම අංශය මගින් සිදු කරයි.

ඒ අනුව ඇඟළුම් ව්‍යාපාරයක් හා සත්ත්ව ගොවිපළක් ආරම්භ කිරීමට මූලික ප්‍රාග්ධනය සපයා ගැනීම පිණිස දානපතීන් සමග සම්බන්ධීකරණ කටයුතු 2021 වසර තුළ සිදු කර ඇත.









ස්වයං රැකියාවන් සඳහා දිරි ගන්වන ලද රණවිරුවන් විසින් සිදු කරන ආදායම් උත්පාදක ව්‍යාපෘති

08

පළාත් හා විශේෂ ව්‍යාපෘති අංශය

8.1.හැඳින්වීම

රණවිරු සේවා අධිකාරිය මගින් දිවයින පුරා ව්‍යාප්තව සිටින රණවිරු පවුල් ඒකරාශී කරමින් පවත්වාගෙන යන රණවිරු සංසද ජාලය ක්‍රමවත්ව පවත්වාගෙන යාම මගින් වඩාත් පුළුල් සේවාවක් රණවිරුවා වෙත ලබා දීම සඳහා පළාත් හා විශේෂ ව්‍යාපෘති අංශය මගින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි. රණවිරු ප්‍රජාවෙහි අවශ්‍යතා හඳුනා ගනිමින් අවශ්‍යතා කළමනාකරණය කිරීමේ වගකීම පළාත් අංශය සතු වේ. රණවිරුවන් වෙතින් ලැබෙන ඉල්ලීම් සලකා බලා ඒවාට ක්ෂණික ප්‍රතිචාර දැක්වීම, හදිසි ආපදා අවස්ථා සඳහා ආධාර ලබා දීම, රණවිරු ගම්මාන නඩත්තුව ආදී කාර්යයන් රාශියක් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

8.2. හදිසි ආපදා ආධාර ලබා දීමේ වැඩසටහන

ගංවතුර, සුළි සුළං, නායයාම්, ගිනිගැනීම් වැනි හදිසි ආපදා තත්ත්වයන්ට ලක්වූ එක් රණවිරු පවුලකට අවශ්‍යතාවය මත රු.100,000.00ක උපරිමයකට යටත්ව මූල්‍යමය ආධාර පිරිනැමීම හා සංසද සාමාජිකත්වය දරන රණවිරුවන්ගේ හදිසි අභාවයන් සඳහා රු.10,000.00ක ආධාර මුදලක් පරිත්‍යාග කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරයි.

8.2.1. ස්වභාවික ආපදාවන්ට ලක් වූ රණවිරු පවුල් වෙත ආධාර ලබා දීම

අනු අංකය	විස්තරය	දිස්ත්‍රික්කය	ආධාරයේ වටිනාකම (රු)
01	සිතාවක රණවිරු සංසදයේ දිවිපිදූ රණවිරුවකුගේ දෙමව්පියන් වෙත වියලි ආහාර සලාක පාර්සල් ලබාදීම	කොළඹ	6,016.25
02	සෙ/2ඊ01075 සැරයන් චන්න කුමාර රණවිරුවාගේ නිවසේ පැති බැම්ම නායයෑම නිසා සිදුවූ හානියෙන් නැවත එම බැම්ම ඉටි රෙදි යොදා ආවරණය කිරීම සඳහා වැය වූ මුදල ප්‍රතිපූර්ණය කිරීම	ගම්පහ	8,880.00
03	වර්ෂාව හේතුවෙන් ඩබ්.එච්.එම්.ඉන්ද්‍රාකුමාරි රණවිරු බිරිඳගේ නිවසේ වහලය කඩා වැටීම	ගම්පහ	100,000.00
04	ගංවතුර හේතුවෙන් ඩී.ඩී.එස්.කේ.ප්‍රනාන්දු රණවිරුවාගේ නිවසට හානි සිදුවීම	ගම්පහ	25,000.00
05	ගංවතුර හේතුවෙන් ප්‍රියාල් මුතුකුමාරණ රණවිරුවාගේ නිවසට හානි සිදු වීම	ගම්පහ	100,000.00
06	එල්.පී.ඒ.එස්.අබේසිංහ රණවිරුවාගේ නිවසෙහි මිදුල අවට පස් පුරවා සකස් කර ගැනීම	ගම්පහ	100,000.00
07	ගංවතුර තත්ත් වය හේතුවෙන් ඩබ්.එම්.ඒ.පි.කේ විජේසුන්දර රණවිරුවාගේ මත්ස්‍ය ව්‍යාපාරයට අලාභ හානි සිදුවීම	රත්නපුර	100,000.00
08	වර්ෂාව හේතුවෙන් එස්.එම් දිල්හානි කුමාරි රණවිරු බිරිඳගේ නිවස ආපාදාවට ලක්වීම	රත්නපුර	100,000.00

09	වර්ෂාව හේතුවෙන් ඩබ් පත්මසිරි රණවිරුවාගේ නිවස සම්පූර්ණයෙන් කඩා වැටීම	රත්නපුර	100,000.00
10	කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල සංසදයේ කේ.ඒ.වික්‍රමසිංහ රණවිරුවා (පූර්ණ ආබාධිත)පදිංචි ප්‍රදේශය හුදකලා කර ඇති බැවින් ඒ වෙනුවෙන් වියලි සලාක ලබා දීම	කුරුණෑගල	6,002.50
11	වර්ෂාව හේතුවෙන් ඩබ්.ඒ.පි චාන්දනී රණවිරු බිරිඳගේ නිවස ආපාදාවට ලක්විම	මහනුවර	70,000.00
12	වර්ෂාව හේතුවෙන් එම්.ඒ.ඉන්ද්‍රානී රණවිරු බිරිඳගේ නිවස ආපාදාවට ලක්විම	මහනුවර	70,000.00
13	ආර්.එම්.ආර් රත්නායක රණවිරුවාගේ නිවසේ මිදුල කොටසෙහි ඉදිකර තිබූ පැති බැම්මෙහි කොටසක් ගැලවි යාම	මහනුවර	100,000.00
14	වර්ෂාව හේතුවෙන් පස් කන්දක් වැටී ඒ.එම්.එල්.එස්.කේ අලහකෝන් රණවිරුවාගේ නිවස පිටුපස කොටසෙහි ජනෙල් මට්ටම තෙක් යටවීම	මහනුවර	100,000.00
15	එන්.එම් ප්‍රේමජයන්ත රණවිරුවාගේ නිවස පිටුපස නාය යාම	ගාල්ල	32,000.00

8.2.2. හදිසි අභාවයන්ට ලක් වූ රණවිරුවන් වෙනුවෙන් ආධාර ලබා දීම

අනු අංකය	හදිසි අභාවයට පත් වූ රණවිරුවාගේ නම	සෙ/අංකය	දිස්ත්‍රික්කය	ලබා දුන් මුදල
01	ඩී.බී.හීන්බණ්ඩා	සෙ/62282	අනුරාධපුරය	10,000.00
02	ඒ.එම්.ආර්.ඩබ් අධිකාරි	සෙ/507294	අනුරාධපුරය	10,000.00
03	ඒ.එම්.චන්දන	සෙ/101384	අනුරාධපුරය	10,000.00
04	කේ.ඒ.ඩී.ධම්මික	සෙ/462710	අම්පාර	10,000.00
06	පී.එඒ.ඩි.ඒ.එන් විජේසිංහ	නි/67178	අම්පාර	10,000.00
07	පී.එල් ජනක	සෙ/552696	කළුතර	10,000.00
08	එස්.එම්.එස්.ඩි.ආර් සමරවීර	සෙ/355980	කළුතර	10,000.00
09	ජී.ඩී.උපුල් සමන්තිලක	සෙ/405020	කළුතර	10,000.00
10	එන්.එම්.කරුනාතිලක	සෙ/001860	කෑගල්ල	10,000.00
11	ජේ.ආර්.එස්.ජේ මුණසිංහ	සෙ/33077	කෑගල්ල	10,000.00
12	හෙට්ටිආරච්චි	සෙ/506545	කුරුණෑගල	10,000.00
13	ඒ.එම්.සිරිසේන	සෙ/351631	කුරුණෑගල	10,000.00
14	කේ.එම් කුඩාබංඩා	සෙ/00500	කුරුණෑගල	10,000.00
15	එම්.එන් ධර්මසිරි	සෙ/351409	කුරුණෑගල	10,000.00
16	එච්.එම් කපිලරත්න	5 ඩි 00358	කුරුණෑගල	10,000.00
17	එස්.එම්.එම්.ජේ බණ්ඩාර	සෙ/55968	කුරුණෑගල	10,000.00
18	ආර්.එම්.පද්මානන්ද	සෙ/401320	කුරුණෑගල	10,000.00
19	ඩබ්.ඩී.තිලකසිරි	5/2R 00618	කොළඹ	10,000.00

21	යූ.එන්.පි.පි ගුණවර්ධන	සෙ/776064	කොළඹ	10,000.00
22	එච්.ඩී.ඩී.පි කුමාර	සෙ/5225613	කොළඹ	10,000.00
23	ආර්.එච්.ඒ.ජේ රණසිංහ	සෙ/501654	කොළඹ	10,000.00
24	එස්.එච්.එස් කරුණාරත්න	සෙ/14694	කොළඹ	10,000.00
25	එස් අතුකෝරල	සෙ/11881	ගම්පහ	10,000.00
26	යූ.ජී සුසන්ත කුමාර ආරියරත්න	සෙ/302665	ගම්පහ	10,000.00
27	එස්.ඒ.ඒ.මුනාස්	පීඑස් /62108	ත්‍රිකුණාමලය	10,000.00
28	එන්.එස්.මනෝජ් නිශාන්ත	සෙ/352320	නුවරඑලිය	10,000.00
29	ඩබ්.එම්.විජේසිරි	සෙ/78514	පුත්තලම	10,000.00
30	ජේ.පී සනත් කුමාර	සෙ/418749	පොළොන්නරුව	10,000.00
31	ජී.එච් අනුර විජේබණ්ඩාර	සෙ/3H 01623	පොළොන්නරුව	10,000.00
32	ජී.ආර් අජිත් බංඩාර	සෙ/11G00688	පොළොන්නරුව	10,000.00
33	එච්.ජී.පි.කේ ජයසේකර	සෙ/363735	මහනුවර	10,000.00
34	එම්.එස්.එල් රංජන් කුමාර	සෙ/473850	මහනුවර	10,000.00
35	පී.කේ.ඩබ්.මනම්පේරි	සෙ/353817	මාතර	10,000.00
36	පී.ජී.සරත් ආනන්ද	සෙ/302767	මොනරාගල	10,000.00
37	බී.එම්.යූ.දිසානායක	සෙ/314844	මොනරාගල	10,000.00
38	යූ.එම්.සරත් ගුණසේකර	සෙ/506684	රත්නපුරය	10,000.00
39	ජී. ප්‍රේමසිරි	සෙ/3500014	හම්බන්තොට	10,000.00





වර්ෂාව හේතුවෙන් සිය නිවස කඩා වැටී හදිසි ආපදා ආධාර ලබා දීමෙන් පසු නව නිවසක් සඳහා මුල් ගල් තබනා රණවිරු පවුලක්





පස්යාල රණවිරු ගම්මානයේ නායයෑම් තත්ත්වය නිරීක්ෂණය කිරීම හා ආපදා ආධාර ලබා දීම

8.3. රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

රණවිරු ගම්මානවල පදිංචිය ආරම්භ කිරීමත් සමඟ රණවිරු පවුල් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ යටිතල පහසුකම් සපයාගැනීමයි. ඒ සඳහා මධ්‍යම ආණ්ඩුව සහ ඒ යටතේ වගකිවයුතු ආයතන දැනුවත් කොට අදාළ කටයුතු සිදු කරදීමට මැදිහත්ව ක්‍රියාකරනු ලබයි. එසේම ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් කණ්ඩායම් හැඟීම වර්ධනය වන පරිදි ප්‍රමුඛතා පදනම මත පළාත් මට්ටමින් ප්‍රජා ශාලා ඉදිකිරීම, සංස්කෘතික මධ්‍යස්ථාන ඇති කිරීම, පුස්තකාල ඇති කිරීම, පාරිසරික මධ්‍යස්ථාන ඇති කිරීම, ප්‍රජා ජල ව්‍යාපෘති, අභ්‍යන්තර මාර්ග නඩත්තුව හා ඉදි කිරීම් ඇතුළු රණවිරු ගම්මානවල අත්‍යවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම මෙමගින් සිදු කරයි.

8.3. 1. දීප ව්‍යාප්ත රණවිරු ගම්මාන

අනු අංකය	ගම්මානයේ නම	ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය	පදිංචි පවුල් සංඛ්‍යාව
01	සාලාව රණවිරු ගම්මානය	සීතාවක	108
02	පැලෑදගොඩ රණවිරු ගම්මානය	හෝමාගම	50
03	කැරගල රණවිරු ගම්මානය	දොම්පේ	92
04	වතුපිටිවල රණවිරු ගම්මානය	අත්තනගල්ල	111
05	උඩුපිල රණවිරු ගම්මානය	මහර	57
06	වල්බෝතලේ රණවිරු ගම්මානය	මීරිගම	25
07	හුණුපොළ රණවිරු ගම්මානය	අත්තගල්ල	10
08	නුගේදොලවත්ත රණවිරු ගම්මානය	මීරිගම	38
09	දොඹගොඩ රණවිරු ගම්මානය	හොරණ	101
10	ගල්කැටිය - ක්ලයිඩ් කොටස රණවිරු ගම්මානය	දොඩම්ගොඩ	0
11	කිදෙල්පිටිය මිල්ලෑව රණවිරු ගම්මානය	හොරණ	27
12	ගෝවින්න රණවිරු ගම්මානය	බුලත්සිංහල	7
13	කෝපියාවත්ත - දැවිරුගම රණවිරු ගම්මානය	කළුතර	43
14	මිල්ලනිය දාමින්දගමුව රණවිරු ගම්මානය	මිල්ලනිය	9
15	අගලවත්ත රණවිරු ගම්මානය	අගලවත්ත	1
16	යටදොලවත්ත රණවිරු ගම්මානය	මතුගම	1
17	පර්ත් ස්ටේට් රණවිරු ගම්මානය	ඉංගිරිය	19
18	පැපැලියගහලන්ද රණවිරු ගම්මානය	බෙරුවල	5
19	කුරුවිට රණවිරු ගම්මානය	කුරුවිට	36
20	කලවාන රණවිරු ගම්මානය	කලවාන	4
21	බලංගොඩ රණවිරු ගම්මානය	බලංගොඩ	10
22	මාබෙල්ටන් වත්ත රණවිරු ගම්මානය	කුලියාපිටිය	8
23	ස්මිලයින් රණවිරු ගම්මානය	පන්නල	10
24	දෙනවරවත්ත රණවිරු ගම්මානය	මාවතගම	10
25	ඩෙන්සිල් කොබ්බෑකඩුව රණවිරු ගම්මානය	අඹන්පොල	10
26	පාන්ගොල්ල රණවිරු ගම්මානය	ඉබ්බාගමුව	99
27	සුන්දරගම රණවිරු ගම්මානය	වාරියපොල	7
28	හලාවත රණවිරු ගම්මානය	හලාවත	11
29	රඹෑව රණවිරු ගම්මානය	රඹෑව	26

30	ගල්නෑව රණවිරු ගම්මානය	ගල්නෑව	44
31	මරදන්කඩවල රණවිරු ගම්මානය	කැකිරාව	34
32	රණජයපුර රණවිරු ගම්මනාය	කැකිරාව	1120
33	පැරකුම්-දියබෙදුම	ඇලහැර	17
34	පල්ලේකැලේ රණවිරු ගම්මානය	කුණ්ඩසාලේ	31
35	විරුසහන රණවිරු ගම්මානය	කුණ්ඩසාලේ	14
36	රණවිරු උයන රණවිරු ගම්මානය	කුණ්ඩසාලේ	30
37	අලුවිහාරය රණවිරු ගම්මානය	මාතලේ	12
38	ජයපුර-විරු සහන රණවිරු ගම්මානය	නාඋල	10
39	යුධ හමුදා දේශප්‍රේමී (තිලකපුර) ගම්මානය	අම්බලන්ගොඩ	9
40	ලකී විජේරත්න ගම්මානය	අක්මීමණ	24
41	මාපලගම රණවිරු ගම්මානය	නාගොඩ	34
42	වැවහමන්දුව රණවිරු ගම්මානය	මාතර	7
43	ලුණුගම්වෙහෙර රණවිරු ගම්මානය	ලුණුගම්වෙහෙර	36
44	ලුණම රණවිරු ගම්මානය	අම්බලන්තොට	31
45	පෙරහෙට්ටිය රණවිරු ගම්මානය	හාලිඇල	24
46	රණවිරුපුර රණවිරු ගම්මානය	වැල්ලවාය	12
47	හොරොම්බුව රණවිරු ගම්මානය	මොණරාගල	3
48	නවගම්පුර රණවිරු ගම්මානය	අම්පාර	20
49	වෙල්ගම්වෙහෙර රණවිරු ගම්මානය	නගර හා කඩවත් සතර	8

8.3.2. 2021 වර්ෂය තුළ රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

8.3.2.1. රණවිරු දරුවන් වෙනුවෙන් සංස්කෘතික කලායතනයක් ආරම්භ කිරීම

දේශයේ භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීත්වය වෙනුවෙන් සටන් වැදී තම ජීවිතය පූජා කළ රණවිරුවන්ගේ හා තම ශරීරාංග පූජා කළ උතුරු මැද පළාතේ රඹෑව රණවිරු ගම්මානයේ රණවිරුවන්ගේ දූ දරුවන් සඳහා අත්වැලක් වීමට රණවිරු සේවා අධිකාරියේ උතුරු මැද පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ තුෂාර ජයසිංහ මහතා සහ අනුරාධපුර දිස්ත්‍රික් නිලධාරී සුපුන් මිල්ලවාන මහතාගේ සහ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව හා තරුණ සේවා සභාවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2021.02.15 දින සංස්කෘතික කලායතනයක් ආරම්භ කරන ලදී.





සංස්කෘතික කලායතනය- රඹෑව රණවිරු ගම්මානය

8.3.2.2. කලවාන රණවිරු ගම්මානය සඳහා ජල ටැංකියක් ලබා දීම

රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කලවාන රණවිරු ගම්මානයේ පොදු පරිභෝජන අවශ්‍යතාවක්ව පැවති පානීය ජලය ගබඩා කළ හැකි ලීටර 10500 ජල ටැංකියක් රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පරිත්‍යාග කරන ලදී.



8.3.2.3. මහනුවර දිස්ත්‍රික්කයේ "විරු සහන" රණවිරු ගම්මානය සඳහා සංගීත භාණ්ඩ ලබා දීම

මහනුවර දිස්ත්‍රික්කයේ "විරු සහන" රණවිරු ගම්මානයේ ජීවත් වන ප්‍රතිලාභී පවුල්වල සාමාජිකයන්ගේ සංගීත කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සහ ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් සංගීත භාණ්ඩ සහ ක්‍රීඩා උපකරණ බෙදා දීමේ වැඩසටහන "විරු සහන" රණවිරු ගම්මානයේ දී සිදු කරන ලදී.

රණවිරු සේවා අධිකාරියේ මහනුවර දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරී අජන්තා හේරත් මහත්මියගේ සංවිධානයෙන් සිදු කරනු ලැබූ මෙම වැඩසටහන සඳහා රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමන් නියෝජනය කරමින් මධ්‍යම පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂක, හේමචන්ද්‍ර ගුණදාස මහතා සහභාගී වන ලදී.





සංගීත හා ක්‍රීඩා භාණ්ඩ බෙදා දීම

අනු අංකය	විස්තරය	දිස්ත්‍රික්කය
01	මරදන්කඩවල රණවිරු ගම්මානයේ සුභසාධක සමිතිය සඳහා වැසි ආවරණ කට්ටලයක් ලබා දීම	අනුරාධපුරය
02	ගල්නෑව රණවිරු ගම්මානයේ නව ප්‍රජා ශාලාව සඳහා විදුලි බල පහසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය	අනුරාධපුරය
03	කොස්ගම ස්වර්ණ ජයන්ති රණවිරු ගම්මානය - ප්‍රජා ශාලාව අළුත් වැඩියා කිරීම	කොළඹ
04	අම්පාර නවගම්පුර රණවිරු ගම්මානයේ ප්‍රජාශාලාව සඳහා වැසිකිලිය ඉදිකිරීම	අම්පාර
05	කලවාන රණවිරු ගම්මානය සඳහා ජලටැංකි ලබා දීම	රත්නපුරය
06	බලගොල්ල කෙන්ගල්ල රණවිරු ගම්මානය සඳහා සංගීත භාණ්ඩ ලබා ගැනීම	මහනුවර
07	බලංගොඩ රනවිරු ගම්මානයේ ඔප්පු ලබා දීම	රත්නපුරය
08	සෙ/358394 එම්.එස්.එස් විරසිංහ රණවිරුවා වෙත නළ ලිදක් ඉදි කර ගැනීම සඳහා මුදල් ලබා දීම	කුරුණෑගල

09

රණවිරු අනුස්මරණ වැඩසටහන

9.1. හැඳින්වීම

රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම හා හිතකර සියලු ක්‍රියා හා දේ යටතේ යුද නාවික හා ගුවන් හමුදාවේ මෙන්ම පොලිසියේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුහි සේවය කොට රට වෙනුවෙන් දිවිපිදූ දේශප්‍රේමී විරෝදාර රණවිරුවන් හා මාතෘභූමියේ චිරස්ථිතිය උදෙසා තම ශරීරාංග කැප කළ වීර වික්‍රමාන්විත රණවිරුවන් අනුස්මරණය කරමින් ජාතියේ උපහාරය පිරිනමා රණවිරුවාගේ නාමය අඛණ්ඩව සුරක්ෂිත කිරීම හා ඔවුන්ගේ සුභසාධන අවශ්‍යතා සපුරාලීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරයි.

9.2. ජාතික රණවිරු දින සැමරුම් උත්සවය

ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ අභීත විරෝදාර රණවිරුවන් වෙත සමස්ත ශ්‍රී ලංකා රජයේ සහ පොදු මහත් ජනතාවගේ ගෞරවාන්විත උත්තමාචාරය පුද කරනු ලබන 2021 රණවිරු අනුස්මරණ දිනය පසුගිය 2021 මැයි මස 19 වන දින ප.ව 4.00 බත්තරමුල්ල පාර්ලිමේන්තු ක්‍රීඩාංගනයේ රණවිරු අනුස්මරණ ස්මාරකය අභියසදී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ත්‍රිවිධ හමුදාපතිවරු සහ වැඩබලන පොලිස්පතිතුමන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

ලොව තුළ උද්ගතවී ඇති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙම අභිමානවත් සැමරුම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් සිදු කළ අතර වෙනත් වර්ෂවල මෙන් නොව ආරාධිතයින් සහ රණවිරු පවුල්හි සාමාජිකයින් සුලු පිරිසකට පමණක් සීමා කොට ඉතාමත් වාම් අයුරින් අභිමානවත්ව හා ගෞරවාන්විතව සැමරීමට කටයුතු කරන ලදී.

කෙරෝනා තත්ත්වය හේතුවෙන් රට තුළ පනවා තිබූ සංචරණ සීමා හමුවේ රණවිරු සංසද සාමාජිකයින් තම නිවෙස්වල සිට පහන් දල්වා, රුක් රෝපණය කරමින් රණවිරුවන් හට තම කෘතවේදීත්වය පළ කෙරිණි.

















ජාතික රණවිරු අනුස්මරණ උළෙල හා රණවිරු සැමරුමට සමගාමීව සිදු කරනු ලැබූ රුක් රෝපණ වැඩසටහන් හා ඥාතීන් ස්මරණය කිරීම

9.3. මයිලපිටිය රණවිරු අනුස්මරණ උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු

ශ්‍රී ලංකා භූමිය ත්‍රස්තවාදයෙන් මුදවා ගැනීමේ දී දිවි පිදූ රණවිරුවන් සිහි කරලීම සඳහා ඉදි වූ ශ්‍රී ලංකාවේ පළමු ජාතික රණවිරු අනුස්මරණ උද්‍යානය මෙය වේ. ආකර්ෂණීය භූමි භාගයක පවත්වා ගෙන යනු ලබන මයිලපිටිය රණවිරු සැමරුම් උද්‍යානය තුළ, දිවි පිදූ සියලුම රණවිරුවන්ගේ නාමයන් ශෛලමය පුවරු මත ප්‍රතිෂ්ඨාපනය කර, රණවිරුවන් අනුස්මරණය කිරීම සඳහා ස්මාරකයක් සහිතව රණවිරු අනුස්මරණ උද්‍යානයක් ඉදි කර ඇත. 2003 වර්ෂයේ දී ජාතික රණවිරු අනුස්මරණ ජාතික උත්සවය මෙම ස්ථානයේ දී පවත්වන ලදී.

මෙම උද්‍යානයේ ජලය, විදුලිය හා නඩත්තු සඳහා වැය දැරීම් රණවිරු සේවා අධිකාරිය විසින් සිදු කරනු ලබන අතර ආරක්ෂාව හා නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ සහයෝගය ලබා දීම සිදු කරනු ලැබේ.



මයිලපිටිය රණවිරු අනුස්මරණ උද්‍යානය

9.3.1. 2021 වර්ෂය තුළ මයිලපිටිය උද්‍යානයේ නඩත්තු කටයුතු සිදු කිරීම





මයිලපිටිය උද්‍යානයේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම





මයිලපිටිය උද්‍යානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා උපකරණ මිල දී ගැනීම

10
විශ්‍රාමික රණවිරු සුභසාධන අංශය

10.1. හැඳින්වීම

රට වෙනුවෙන් තම තරුණ ජීවිතය කැප කරමින් විශ්‍රාම යන රණවිරුවන් ඔවුන් ප්‍රගුණ කළ කුසලතාවයන් උපයෝගී කර ගනිමින් රැකියා අවස්ථා සඳහා යොමු කිරීම හා කෘෂිකාර්මික හා කාර්මික ව්‍යවසායකයින් බවට පත්කිරීම අරමුණු කර ගනිමින් වැඩමුළු, උපදේශන සේවා, පුහුණු සැසි ක්‍රියාත්මක කිරීම මෙම අංශය මගින් සිදු කරයි.

10.2. කාබනික පොහොර නිෂ්පාදනයට රණවිරුවන් යොමු කිරීමෙහි සැලසුම් සකස් කිරීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභී පවුල්වල සාමාජිකයන්ගේ දායකත්වය ලබා ගනිමින් ජාතික හරිත ආර්ථිකයක් නිර්මාණය කරනු වස් අතිගරු ජනාධිපතිතුමන්ගේ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශන වැඩපිළිවෙළට ශක්තියක් වෙමින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා විශ්‍රාමික රණවිරුවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් සම්බන්ධ කිරීමේ විශේෂ වැඩපිළිවෙලක් වෙනුවෙන් මූලික සාකච්ඡා වටයක් පවත්වා ලද අතර, එහි ප්‍රගතිය සමාලෝචනය කරමින් ඉදිරි වැඩ කටයුතු පිළිබඳ සැලසුම් කිරීමෙහි සාකච්ඡාවක් රණවිරු සේවා අධිකාරියේ දී පැවැත්විණි.

හතළිස් හත් දහසකට ආසන්න රණවිරු සේවා අධිකාරියේ සේවාලාභී පවුල් අතරින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා උනන්දුවක් දක්වන සාමාජික පවුල් ඉලක්ක කරගනිමින් මෙම ව්‍යාපෘතිය කෙටිකාලීනව දියත් කිරීමට සැලසුම් සකස් කරන ලදී.

මෙහිදී රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභී පවුල්වල දිවයිනේ ප්‍රධාන පළාත් 7ක දැනට ජීවත්ව සිටින රණවිරුවන් 500කට ආසන්න ප්‍රමාණයක් වාණිජමය වශයෙන් කාබනික පොහොර නිෂ්පාදනයට යොමු කිරීම සඳහා වන මූලික සැලසුම් සාකච්ඡාවට භාජනය කරනු ලැබීය. හරිත ආර්ථිකයක් සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ නියෝජිත විජිත් වැලිකල මහතා ඇතුළු එම කාර්ය මණ්ඩල නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙම මෙම සාකච්ඡාවෙහි ප්‍රතිඵලයක් වශයෙන් **"රණබිමෙන් ගොවිබිමට - සරුපසේ පෙරළිය"** යන තේමාව යටතේ ගාල්ල, මාතර, කළුතර, ගම්පහ, අනුරාධපුර හා මාතලේ යන දිස්ත්‍රික්කයන්හි කාබනික පොහොර නිෂ්පාදන වැඩමුළු 06ක් 2021 වසර තුළ ක්‍රියාවට නැංවීමට රණවිරු සේවා අධිකාරියට හැකියාව ලැබිණි.



10.2.1. "රණබිමෙන් ගොවිබිමට - සරුපසේ පෙරළිය" කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

10.2.1.1. අනුරාධපුර දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභී පවුල්වලින් මූලිකව තෝරාගන්නා ලද පවුල් පන්සියයක් (500) කාබනික පොහොර භාවිතයට යොමු කරමින් කුඩා පරිමාණ ව්‍යවසායකයන් බවට පත් කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන දිස්ත්‍රික් වශයෙන් තෝරා ගන්නා ලද ඒ සඳහා කැමැත්තක් දක්වන සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවත්වන රණවිරු පවුල් සාමාජිකයන් 79 දෙනෙකු සඳහා කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ මූලික දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන 2021.06.28 පවත්වන ලදී.

රණවිරු සේවා අධිකාරිය මගින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත කරන ලද ඉල්ලීමකට අනුව කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව මිහින්තලය සිවිල් ආරක්ෂක පුහුණු පාසලේදී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා සහභාගිවීමට රණවිරු පවුල් සාමාජිකයන්හට අවස්ථාව හිමිවිය.

මෙම මූලික දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහනේදී මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ හා ලංකා බයෝ පොහොර සමාගමේ නිලධාරීන් විසින් අඩු කාලසීමාවක් තුල කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කරන පිළිවෙල සම්බන්ධයෙන් වැඩසටහනට සහභාගි වූ සාමාජිකයන් දැනුවත් කරන ලදී.



10.2.1.2. මාතර දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

කාබනික පොහොර නිෂ්පාදනයට සහ වස විසෙන් තොර ආර්ථිකයකට රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභී පවුල් යොමු කරවීමේ අරමුණ ඇතිව සංවිධානය කරන ලද පළමු දැනුවත් කිරීමේ වැඩසටහන 2021ජූලි මස 20 වන අඟහරුවාදා මාතර දිස්ත්‍රික්කයේදී පවත්වන ලදී.මානුෂීය මෙහෙයුමේ දී තුවාල ලබා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගොස් සිටින විශ්‍රාමික රණවිරු ප්‍රියන්ත කුමාර මහතාගේ ගෙවත්තේ දී යුද්ධයෙන් ආබාධයට ලක්ව මාතර දිස්ත්‍රික්කයෙ ජීවත්වන කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කැමැත්තක් දක්වන තවත් රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු විසි පස් දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහන පවත්වනු ලැබීය.

මෙම සමාරම්භක දැනුවත් කිරීමේ වැඩසටහන මාතර දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් රණක්ෂිතයට පත් වූ රණවිරුවන් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමු කරවීමේ අරමුණු කර ගනිමින් නියමු ව්‍යාපෘතියක් ලෙස සංවිධානය කරන ලදී.

කෘෂිකාර්මික උපදේශක නිලධාරීන් විසින් ආබාධිත රණවිරුවන් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමුවිය යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදුකරන ලදී. ඉන් අනතුරුව ප්‍රායෝගිකව කාබනික පොහොර ගෙවත්ත තුළ දී නිෂ්පාදනය කර ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමක් ද සිදු කරන ලදී.




මාතර දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන වැඩමුළුවේ විශේෂ අවස්ථා

10.2.1.3. ගාල්ල දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන

කාබනික පොහොර නිෂ්පාදනයට සහ වස විසෙන් තොර ආර්ථිකයකට රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභී පවුල් යොමු කරවීමේ අරමුණ ඇතිව සංවිධානය කරන ලද දෙවන දැනුවත් කිරීමේ වැඩසටහන 2021 ජූලි මස 27 වන අහහරුවාදා ගාල්ල ලබුදුව රජයේ ගොවිපළේ දී පවත්වන ලදී. රණවිරු පවුල්වල සාමාජිකයන් විසි දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම පුහුණු වැඩසටහන පවත්වනු ලැබීය.

මෙම වැඩසටහනෙහි දී ගාල්ල ලබුදුව රජයේ ගොවිපළේ කෘෂිකාර්මික උපදේශක නිලධාරීන් විසින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමුවිය යුතු ආකාරය විදහා දැක්වෙන දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදුකරන ලදී. ඉන් අනතුරුව ප්‍රායෝගිකව කාබනික පොහොර නිෂ්පාදනය කර ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමක් ද සිදු කරන ලදී.




ගාල්ල දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩමුළුව

10.2.1.4. ගම්පහ දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

කාබනික පොහොර නිෂ්පාදනයට සහ වස විසෙන් තොර ආර්ථිකයකට රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභී පවුල් යොමු කරවීමේ අරමුණ ඇතිව සංවිධානය කරන ලද තෙවන දැනුවත් කිරීමේ වැඩසටහන 2021 අගොස්තු මස 2 වන සදුදා අඹේපුස්ස පිහිටි ගම්පහ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිටින කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කැමැත්තක් දක්වන රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ බිරින්දෑවරුන් ඇතුළු 15 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම පුහුණු වැඩසටහන පවත්වනු ලැබීය.




ගම්පහ දිස්ත්‍රික් කාබනික පොහොර නිපදවීමේ විශේෂ අවස්ථා

10.2.1.5. අනුරාධපුර දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සිටින රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභීන් ඉලක්ක කොට ඔවුන් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා දිරි ගැන්වීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහනක් මහඉලුප්පල්ලම පිහිටි සේවා සංස්කරණ අභ්‍යාස විද්‍යාලයේ දී පවත්වන ලදී.
2021.08.03

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ රණක්ෂිතයට පත්ව සිටින කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කැමැත්තක් දක්වන රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ බිරින්දෑවරුන් ඇතුළු 25 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම පුහුණු වැඩසටහන මහඉලුප්පල්ලම දී පවත්වනු ලැබීය.




මහඉලුප්පල්ලම දී පැවති පුහුණු වැඩසටහනේ විශේෂ අවස්ථා

10.2.1.6. කළුතර දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

කාබනික පොහොර නිෂ්පාදනයට සහ වස විසෙන් තොර ආර්ථිකයකට රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභී පවුල් යොමු කරවීමේ අරමුණ ඇතිව සංවිධානය කරන ලද තවත් දැනුවත් කිරීමේ වැඩසටහනක් පසුගියදා හොරණ පිහිටි කළුතර දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය තුළ සිටින කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කැමැත්තක් දක්වන රණවිරුවන් 15 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම පුහුණු වැඩසටහන පවත්වනු ලැබීය.





කලුතර දිස්ත්‍රික් කාබනික පොහොර නිපදවීම පිළිබඳ පුහුණු වැඩමුළුවේ අවස්ථා

10.2.1.7. මාතලේ දිස්ත්‍රික් කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන

මාතලේ දිස්ත්‍රික්කය කේන්ද්‍ර ගත කරමින් පවත්වන්නට යෙදුනු කාබනික පොහොර නිෂ්පාදනය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන 2021.12.08 වන බදාදා දින මාතලේ නාලන්ද ගොවිපල පරිශ්‍රයේදී පැවැත්විණි.මේ සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ රණවිරු සංසද නියෝජනය කරමින් රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් පිරිසක් සම්බන්ධ විය





මාතලේ දිස්ත්‍රික් පුහුණු වැඩමුළුවේ විශේෂ අවස්ථා

10.3. මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම

රණවිරු සේවා අධිකාරිය මඟින් ක්‍රියාත්මක "ත්‍රිවිධ හමුදාවේ මානව සම්පත දායේ සංවර්ධන කාර්යය සඳහා දායක කර ගැනීමේ ව්‍යාපෘතිය" යටතේ කෘෂි ව්‍යවසායකයින් බල ගැන්වීම සඳහා මීපැණි කර්මාන්තය ව්‍යාප්ත කිරීම සහ ව්‍යවසායකයින් පුහුණු කිරීම සඳහා අනුග්‍රහය දක්වනු ලැබේ.

මේ යටතේ මී මැසි පාලනය පිළිබඳව උනන්දුවක් දක්වන රණවිරු පවුල් සාමාජිකයන් ඒකරාශී කර ඔවුනට අවශ්‍ය මූලික න්‍යායාත්මක දැනුම ලබා දීම, ප්‍රායෝගික පුහුණුව ලබා දීම හා බිඳු කර්මාන්තයට අවශ්‍ය මී මැසි පෙට්ටි සහ උපකරණ ලබා දීම විශ්‍රාමික රණවිරු සුභසාධන ව්‍යාපෘතිය මඟින් සිදු කරයි.

10.3.1.මී මැසි පෙට්ටි සහ උපකරණ රණවිරු පවුල් වෙත ලබා දීමේ වැඩසටහන

2020 අගොස්තු මස 12,13 හා 14 යන තෙදින තුල 2020 වර්ෂය තුළ බණ්ඩාරවෙල සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය බිදුණු වැව සහ 2020.07.03 වන දින කළුඅග්ගල කඳවුරෙහි පැවති මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූ පිරිස වෙත හා ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාම යාමට නියමිත පිරිස් වෙත ඔවුන්ගේ කර්මාන්තයට අතහිත දීමක් වශයෙන් කර්මාන්ත සහ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ලබා දෙන ලද මී මැසි පෙට්ටි සහ එම උපකරණ රණවිරු පවුල් වෙත ලබා දීමේ වැඩසටහන 2021.01.12 වන දින පවත්වන ලදී.





මී මැසි පෙට්ටි සහ උපකරණ රණවිරු පවුල් වෙත බෙදා දීම

10.3.1.1. අම්පාර දිස්ත්‍රික් මී මැසි පාලනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සංවිධානත්වයෙන් අම්පාර දිස්ත්‍රික්කය කේන්ද්‍රගත කරමින් සංවිධානය කරන ලද මී මැසි පාලනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2021 නොවැම්බර් මස 03 වන දින අම්පාර නවගම්පුර රණවිරු ගම්මානයෙහි ප්‍රජා ශාලාවේදී පවත්වන ලදී. මී මැසි පාලනය සහ ඒ ආශ්‍රිත ව්‍යාපාර අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීමේ මෙම විශේෂ වැඩසටහන සඳහා අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් රණවිරු සාමාජිකයන් 30ක් පමණ

සහභාගී විය.මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය දේශන සහාය ලබා දීම බිහු සම්පත් සුරැකීමේ ආයතනයෙහි පුහුණු දේශක තුෂාර මහින්ද මහතා විසින් සිදු කරන ලදී. ප්‍රායෝගික පුහුණුවකින් අනතුරුව මී මැසි පාලනය සඳහා අවශ්‍ය උපකරණ ද රණවිරුවන් අතර බෙදා දෙනු ලැබීය.

එම අවස්ථාව සඳහා දේශීය කෘෂි අපනයන දෙපාර්තමේන්තුවේ නිලධාරී සුනෙත් හර්ෂණ, රණවිරු සුභසාධන අංශයෙහි ව්‍යාපෘති සහකාර විජේවර්ධන මහතා හා අම්පාර දිස්ත්‍රික්කයෙහි දැනට මී මැසි පාලන ව්‍යාපෘති සිදු කරන ජයතිස්ස මහතා ද සම්පත් දායකයෙකු වශයෙන් සම්බන්ධ වන ලදී.




මී මැසි පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූ පිරිස

10.3.1.2. ගලිගමුව මී මැසි පාලනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන

ත්‍රිවිධ හමුදාවේ මානව සම්පත දැයේ සංවර්ධන කාර්යය සඳහා යොදා ගැනීමේ අරමුණින් මී මැසි පාලනය සම්බන්ධව පුහුණු වැඩමුළුවක් 2021 අප්‍රේල් මස 22 වන දින කෘෂි කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් රණක්ෂිතයට පත් **රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ** පවුල්වල සාමාජිකයන් 33 න් දෙනෙකුගේ සහභාගීත්වයෙන් කෑගල්ල ගලිගමුව සතිපට්ඨාන විහාර භූමියේ දී පවත්වන ලදී.

මේ සඳහා බිහු සම්පත් සුරැකීමේ සංවිධානයේ සභාපති මහින්ද විජේසිංහ මහතා සහ එම කාර්යය මණ්ඩලය විසින් න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දෙන ලදී. මී මැසි පාලනය සහ ඒ ආශ්‍රිත ආර්ථික උපාය මාර්ගික සැලසුම් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම මෙම වැඩමුළුව තුළ දී සිදු කරන ලදී.




වැඩමුළුවෙහි විශේෂ අවස්ථා

10.3.2. එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා ලබා දුන් මී මැසි පෙට්ටි ප්‍රමාණයන්

අනු අංකය	දිස්ත්‍රික්කය	මී මැසි පෙට්ටි ප්‍රමාණය
01	කෑගල්ල	33
02	අම්පාර	31
03	කෑගල්ල	25
04	මාතලේ	50
05	රත්නපුරය	15

10.4. අම්පාර දිස්ත්‍රික් කාබනික පොල් වගාව පිළිබඳ විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන

අම්පාර දිස්ත්‍රික්කයෙහි රණවිරු සංසදවල සාමාජිකයන් 50ක් සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයෙහි අනුග්‍රහය මත පොල් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ විශේෂ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණු වැඩමුළුවක් මහඔය පියාසර ගමෙහි කාබනික පොල්වගා ජනපදය තුළ දී 2021 දෙසැම්බර් මස 29 වන බදාදා දිනය පුරා පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා සහභාගි වූ රණවිරුවන් පනස් දෙනෙකු අතරේ බඳුන් පොල් පැළ සියයක් නොමිලේ බෙදා දීම ද මෙම වැඩසටහන අවසානයේ සිදු කරන ලදී.

රණවිරු සේවා අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරිගේ විශේෂ ආරාධනයෙන් මෙම වැඩසටහන සඳහා අම්පාර දිස්ත්‍රික් පොල් වගා කිරීමේ මණ්ඩලයෙහි සහකාර ප්‍රාදේශීය කළමනාකරු බණ්ඩාර මහතා සහ ගොවිපළ සැලසුම් නිලධාරී හා මහඔය පොල්වගා සංවර්ධන නිලධාරී සුදේෂ් මහතා සම්පත් දායකයින් වශයෙන් සහභාගී විය.

රණවිරු සේවා අධිකාරියේ සභාපති, විශ්‍රාමික මේජර් ජෙනරල් නන්දන සේනාධීර මහතා විසින් සිදුකරන ලද විශේෂ ඉල්ලීමකට ක්ෂණික ප්‍රතිචාර දක්වමින් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති, ආචාර්ය ඒ.වී.කේ මාධවී හේරත් මහත්මිය විසින් මේ සඳහා අවශ්‍ය කඩිනම් පහසුකම් සපයනු ලැබීය.





පොල් වගා කිරීමේ පුහුණු වැඩසටහනෙහි විශේෂ අවස්ථා

10.5. රණවිරු ව්‍යවසායකයන් දිරිගැන්වමින් පවත්වන ලද විශේෂ අවුරුදු පොළ

ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2021 අප්‍රේල් මස 8 සහ 9 යන දෙදින තුළ එම අමාත්‍යාංශ පරිශ්‍රයේ දී පැවැත්වෙන අවුරුදු පොළ සඳහා රණවිරු ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය වෙළෙඳ ඉඩ ප්‍රස්තා ලබාදීමට රණවිරු සේවා අධිකාරිය ක්‍රියාකරන ලදී. රණවිරු සේවා අධිකාරිය විසින් මෙහෙයවනු ලබන ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් මාලාවේ තවත් එක් වැඩසටහනක් ලෙස රට වෙනුවෙන් තම තරුණ ජීවිතය කැප කර විශ්‍රාම ගිය සහ ක්‍රියාන්විතයේදී ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් ව්‍යවසායකයින් බවට පත් කිරීම මෙම ව්‍යායාමයේ අරමුණ විය. මෙහි සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස ගරු ආරක්ෂක ලේකම්තුමන් සහභාගි විය.





අවුරුදු පොළෙහි විශේෂ අවස්ථා

10.6. "හෙළවිරු ඩිජිටල් මෘදුකාංගය" හඳුන්වා දීමේ වැඩසටහන

විශ්‍රාමික සහ රණක්ෂිතයට පත් රණවිරුවන් ඔවුන් විසින් සිදු කරගෙන යනු ලබන කෘෂි නිෂ්පාදන සහ විවිධ වූ නිෂ්පාදන සඳහා වෙලඳපලේ ඉහළ මිලක් සහ ක්ෂණිකව අලෙවි කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් හඳුන්වා දෙන ලද "හෙළවිරු ඩිජිටල් ආර්ථික මධ්‍යස්ථානය සහ මෘදුකාංගය" හඳුන්වාදීමේ වැඩසටහනක් 2021.03.16 වන දින රණවිරු සේවා අධිකාරියේ දී පවත්වන ලදී. මේ අවස්ථාව සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ඩිජිටල් ව්‍යාපෘති සමානාධිකාරි ඉෂාරි සිරිවර්ධන මහත්මිය සහ එම කාර්යය මණ්ඩලය සහභාගී වන ලදී.





හෙළවිරු ඩිජිටල් මෘදුකාංගය හඳුන්වාදීමේ සමාරම්භක අවස්ථාව

11

මාපිය රැකවරණ ව්‍යාපෘතිය

11.1. හැඳින්වීම

යුද්ධයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව දිවි පිදූ, අතුරුදහන් හා ආබාධිත තත්ත්වයට පත්ව වෛද්‍ය හේතූන් මත විශ්‍රාමිකව සිටින (රණවිරු සේවා අධිකාරියේ පනත යටතට ගැනෙන) රණවිරුවන්ගේ ජීවත්ව සිටින දෙමාපියන් වෙත ගෙවනු ලබන මාපිය රැකවරණ දීමනාව (රු.750.00) මසකට වරක් ලබා දීම රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙතින් සිදු කරනු ලබයි. මෙම දීමනාව සඳහා මුදල් බැර කරනු ලබන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන රාජ්‍ය බැංකුවලින් නිකුත් කරනු ලබන මාපිය රැකවරණ ගිණුම් සඳහා පමණි.

පවුලක රණවිරු සාමාජිකයින් කිහිප දෙනෙකු සිටිය ද ජීවත්වී සිටින රණවිරු මවට සහ පියාට වෙන් වෙන්ව මසකට ලැබෙනුයේ රු 750 ක් බැගිනි. යම් පවුලක මියගිය රණවිරුවෙකු සහ ජීවත්වන ආබාධිත රණවිරුවෙකු හෝ දැනට සේවයේ නියුතු රණවිරුවෙකු සිටී නම්, දිවි පිදූ රණවිරුවා වෙනුවෙන් දීමනාව ගෙවනු ලැබේ. මව, පියා ජීවත්වන තුරු පමණක් මෙම දීමනාව හිමි වන අතර කිසිවෙකුටත් මෙම දීමනාව පැවරිය නොහැක. මව පියා මියගිය වහාම අදාළ බැංකුව වෙත පාස් පොත ආපසු භාරදිය යුතු අතර රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත අදාළ මරණයට පත් අයගේ මරණ සහතිකයේ පිටපත ලබාදිය යුතුය.

දීමනා ලාභියා වෙනුවෙන් මාස 06 කට වරක්, සෑම වසරකම ජුනි 15 සහ දෙසැම්බර් 15 දිනට පෙර ජීවත්ව සිටින බවට සහතිකයක් ග්‍රාම සේවා නිලධාරී විසින් සහතික කර රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත එවිය යුතු වේ.

11.2. 2021 වසර තුළ එක් එක් මාසයන්ට අදාළව මාපිය රැකවරණ දීමනා ලබා දීම

අනු අංකය	මාසය	වාර්ෂික කාර්ය සාධනය			
		භෞතික		මූල්‍ය	
		වාර්ෂික ඉලක්කය (ප්‍රතිලභීන්)	කාර්ය සාධනය (ප්‍රතිලභීන්)	වාර්ෂික ඉලක්කය	කාර්ය සාධනය
01	ජනවාරි	36,918	32,751	27,688,500.00	24,563,250.00
02	පෙබරවාරි	36,968	33,000	27,726,000.00	24,750,000.00
03	මාර්තු	37,018	33,087	27,763,500.00	24,815,250.00
04	අප්‍රේල්	37,068	33,086	27,801,000.00	24,814,500.00
05	මැයි	37,118	33,084	27,838,500.00	24,813,000.00
06	ජුනි	37,168	33,312	27,876,000.00	24,984,000.00
07	ජුලි	37,218	33,312	27,913,500.00	24,984,000.00
08	අගෝස්තු	37,268	33,441	27,951,000.00	25,080,750.00
09	සැප්තැම්බර්	37,318	33,441	27,988,500.00	25,080,750.00
10	ඔක්තෝම්බර්	37,368	33,510	28,026,000.00	25,132,500.00
11	නොවැම්බර්	37,418	33,538	28,063,500.00	25,153,500.00
12	දෙසැම්බර්	37,468	33,538	28,101,000.00	25,153,500.00
එකතුව		**446,316**	**399,100**	**334,737,000.00**	**299,325,000.00**


2021 වසර තුළ ප්‍රතිලාභ ලබා දීම
(ප්‍රතිලාභීන් වශයෙන්)
38000
37000
36000
35000
34000
33000
32000
31000
30000
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝම්බර්
නොවැම්බර්
දෙසැම්බර්
වාර්ෂික ඉලක්කය
කාර්ය සාධනය


2021 වසර තුළ මූල්‍ය ප්‍රගතිය
29,000,000.00
28,000,000.00
27,000,000.00
26,000,000.00
25,000,000.00
24,000,000.00
23,000,000.00
22,000,000.00
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝම්...
නොවැම්බර්
දෙසැම්බර්
වාර්ෂික ඉලක්කය
කාර්ය සාධනය

12

විරුසර වරප්‍රසාද කාඩ්පත් අංශය

12.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ගොඩනැගීම වෙනුවෙන් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටිය දී ජීවිත පූජා කළ සහ ආබාධිත වූ ත්‍රිවිධ හමුදාව හා පොලීසිය , සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ සුභසාධනය ඉහළ නැංවීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ රණවිරු සේවා අධිකාරිය මගින් උක්ත රණවිරු ප්‍රජාව වෙනුවෙන් නිසි ගෞරවය ලබාදීම හා ප්‍රමුඛතාවය මත සේවා හා වරප්‍රසාද ලබා ගැනීමේ සමාජ මෙහෙවරක් වශයෙන් විරුසර කාඩ්පතක් පිරිනමනු ලබයි.



12.2. විරුසර කාඩ්පත් පිරිනැමීම පළමු අදියර

යුද්මය කාලසීමාව තුළ ත්‍රිවිධ හමුදාව ,පොලිස් දෙපාර්තමේන්තුව ඇතුළු සිවිල් ආරක්ෂක බලකායේ සේවයේ යෙදී සිටියදී ක්‍රියාන්විතයේදී ජීවිත පරිත්‍යාග කළ සහ අතුරුදහන් වූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හෝ භාරකරු වෙත හා ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් උදෙසා සුභ පළමු අදියර යටතේ කාඩ්පත් ප්‍රදානය කරයි.

12.3.විරුසර කාඩ්පත් පිරිනැමීම දෙවන අදියර

1983 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව තුළ යහපත් පැවැත්මෙන් යුතුව සේවය කර විශ්‍රාම ගිය හා එම වකවානුව ඇතුළත ත්‍රිවිධ හමුදාවට පොලිසියට හා සිවිල් ආරක්ෂක බලකායට බැඳී තව දුරටත් සේවයේ යෙදී සිටින සියලුම රණවිරුවන්ට හා ඉහත කාල සීමාව තුළ දී ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරියේ යෙදී සිටිය දී මියගිය, අතුරුදහන් හා ආබාධිත සිවිල් සේවක මහතුන් ඇතුළු නිලධාරීන් සඳහා නියමිත වසර 20ක හෝ සෙසු නිලයින් සඳහා නියමිත වසර 22ක් ද, කාන්තා නිලයින් හට වසර 15ක සේවා කාලය සපුරා දැනට විශ්‍රාම ගොස් සිටින හො සේවයේ යෙදී සිටින රණවිරුවන්හට දෙවන අදියර යටතේ විරුසර කාඩ්පත පිරිනමනු ලබයි.

12.4. 2021 වසර තුළ මුද්‍රණය කර ඇති විරුසර වරප්‍රසාද කාඩ්පත් ප්‍රමාණය

අදියර	නිකුත් කර ඇති කාඩ්පත් සංඛ්‍යාව				එකතුව
	යුද හමුදාව	**නාවික හමුදාව**	**ගුවන් හමුදාව**	**පොලිස් දෙපාර්තමේන්තුව**	
1	204	4	3	94	305
2	103	25	-	8	136
එකතුව	307	29	3	102	441

12.5. විරුසර කාඩ්පත සඳහා වරප්‍රසාද ලබාදෙන ආයතන

ක්ෂේත්‍රය	ආයතන
සෞඛ්‍ය හා රෝහල්	ආසිරි සර්ජිකල් රෝහල
	ඖෂධ නිතිගත සංස්ථාව
	නවලෝක රෝහල
	නයින්වෙල්ස් රෝහල
	බෝවත්ත බෙහෙත් ශාලාව
	ඒඒ සමරසිංහ ඔප්ටිකල්ස්
	අත්තනායක ඔප්ටිකල්ස්
මුල්‍ය හා කල්බදු	සිඩ්බි ෆිනෑන්ස් පුද්ගලික සමාගම (CDB)
	ලංකා රක්ෂණ ආයතනය
	කොන්ටිනේටල් ඉන්ෂුවරන්ස් ආයතනය
සන්නිවේදන	ලංකා බෙල් ආයතනය
	ටෙලිකොම් ආයතනය
	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතනය
	ව්‍යත්තීය පුහුණු අධිකාරිය
	විජය ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම
	ජාතික ව්‍යාපාර හා කළමනාකරණ ආයතනය
	ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
	ඔස්ට්‍රේලියානු ව්‍යාපාරය
	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
	කාර්මික තාක්ෂණ ආයතනය
ප්‍රවාහන	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
	ශ්‍රී ලංකා ප්‍රවාහන අමාත්‍යාංශය
	ශ්‍රී ලංකන් එයාර් ලයින් ගුවන් සේවය
පාරිභෝගික සැපයුම් ආයතන	සොෆ්ලොජික් පුද්ගලික සමාගම
	කැළණි කේබල්ස්(පීඑල්සී) ආයතනය
	දම්රෝ ආයතනය
	මල්පියලි පබ්ලිකේෂන්ස් ආයතනය
	අබාන්ස් ආයතනය
	සිංගර් ශ්‍රී ලංකා සමාගම
	කාගිලස් ෆුඩ්සිටි
	විජය සමූහ ව්‍යාපාරය
	සොනෙම්රෝ ජුවලර්ස්
	ෆැෂන් බග් ආයතනය
	ටොයොටා ආයතනය

12.6. විරුසර කාඩ්පත් ප්‍රතිලාභීන් සඳහා INSEE සිමෙන්ති ආයතනය මගින් සහන මිලක් යටතේ සිමෙන්ති ලබා දීම

සංස්ථා සිමෙන්ති ආයතනය මගින් විරුසර වරප්‍රසාද කාඩ්පත් හිමි රණවිරුවන් සඳහා සංස්ථා සිමෙන්ති කොට්ට 01 ක් රු. 850.00 ක සහන මුදලක් යටතේ උපරිමය කොට්ට 350ක් දක්වා ලබා දීමට අවස්ථාව උදාකර දී ඇත. ඒ අනුව 2021 වසර තුළ දී එක් එක් දිස්ත්‍රික්කයන්ට සිමෙන්ති ලබා ගැනීම සඳහා ලබා දුන් වවුචර්පත් ප්‍රමාණයන් පහත පරිදි වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	නිකුත් කරන ලද වවුචර්පත් ප්‍රමාණය
01	කොළඹ	63
02	ගාල්ල	11
03	අම්පාර	30



INSEE වවුචර්පත්

විගණකාධිපති වාර්තාව

2021

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඩීරීඑෆ්/ඩී/ආර්එස්ඒ/21/04 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 මැයි 25 දින

සභාපති

රණවිරු සේවා අධිකාරිය

රණවිරු සේවා අධිකාරිය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රණවිරු සේවා අධිකාරිය 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අධිකාරිය සතු ගෘහ භාණ්ඩ සහ උපකරණ හා විදුලි උපකරණ පිළිවෙලින් අයිතම 414 ක් සහ 351 ක් ප්‍රවර්තන වර්ෂය තුල ප්‍රත්‍යාගණනය කර තිබුණු නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 90 වන වගන්තිය ප්‍රකාරව මෙකී ප්‍රත්‍යාගණනයට අදාල විස්තර මුල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කිරීම් කර නොතිබුණි.

(ආ) ආබාධිත උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට යුද්ධ හමුදා පුනුරුත්ථාපන මධ්‍යස්ථානය වෙත රු.10,484,441ක් ගෙවිය යුතුව තිබුණ එම වියදම රු.8,200,000 ක් ලෙස අඩුවෙන් හඳුනා ගැනීම නිසා වර්ෂයේ අතිරික්තය රු. 2,284,441 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාල මාපිය රැකවරණ දීමනා රු.3,108,000 ක් සමාලෝචන වර්ෂයේ වියදමක් ලෙස හඳුනා ගැනීම නිසා සමාලෝචන වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

